දරුවන් ජීවිතයෙන් සමත් කරවන
සර්වාංගීය අධ්‍යාපනයක් සඳහා මං පෙත

# පළමුවන ශ්‍රේණිය

''සෑම දරුවෙකු ම ඔප කළ යුතු මැණිකකි''
තේමා කරගත්
හා
ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ ජාතික අරමුණු වලින් හා ඒ අනුසාරයෙන්
සැකසුනු විෂය මාලාවෙන් අපේක්ෂා කෙරෙන

ක්‍රියාකාරකම් මුල් කරගත් වූද, නිපුණතා පාදක වූද
ශිෂ්‍ය කේන්ද්‍රීය වූද අධ්‍යාපනයක්

නැගෙනහිර පළාතේ සෑම දරුවෙකුට ම ලබාදීම සඳහා වූ අධ්‍යාපන සංවර්ධන
සැලැස්මක් ප්‍රථමයෙන් අම්පාර කලාපයේ අත්හදා බලා ක්‍රියාත්මක කිරීමට
අප අධ්‍යාපන කලාප කාර්යාලයේ ක්‍රියා මූල කමිටුව හා එක්ව ක්‍රියා කළ
විදුහල්පතිවරුන් හා ගුරු භවතුන් වෙත සාදරයෙන් පිරි නැමේ.

**අම්පාර අධ්‍යාපන කලාපයේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි**
**පළමුවන මුද්‍රණය**

දෙවන මුද්‍රණය සඳහා ඔබේ අදහස්
අම්පාර කලාප අධ්‍යාපන කාර්යාලයේ ප්‍රාථමික අංශයට ලබා දෙන්න.
amp@edu.ep.gov.lk 063 222 2139; 071 806 3820

"සියලු ම ළමයින් සහජයෙන් යහපත් ගුණාංග උරුම කොට උපදිති. පරිසරයේ හා වැඩිහිටියන්ගේ වැරදි බලපෑම් නිසා ඒ යහපත් ගුණාංග විනාශ විය හැක. ළමයින්ගේ එම යහපත් ගුණාංග අනාවරණය කොටගෙන වර්ධනය කිරීම හා එමගින් එම ළමයින් තමන්ට සුවිශේෂ වූ අනන්‍යතාවක් සහිත පුද්ගලයන් බවට ගත් කිරීම ගුරුවරයකුගේ වගකීමයි."

තම ආදරණීය ගුරුවරයා වූ කොබයාෂි මහතාගේ අධ්‍යාපන දර්ශනය පිළිබඳව "ටොට්ටෝ චාං" පොතේ කතුවරිය වන ටෙට්සුකෝ කුරොයානගී තම පෙරවදනෙන් පැහැදිලි කරයි. (මූලාශ්‍රයඃ මුල්ලේරියාවේ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය මගින් පළ කෙරුණු ලීලානන්ද ගමාච්චි ගේ 'හරි පුදුම ඉස්කෝලේ' යන පරිවර්තනයේ 2003 දෙවන සංස්කරණය)

# පළාත් අධ්‍යාපන ඇමතිතුමාගේ පණිවිඩය

## අධ්‍යාපනයේ අර්බුදය

සංඛ්‍යා ලේඛනවලට අනුව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන පද්ධතිය දිවයින පුරා පැතිරුණු පාසල් 9731කින් සමන්විත වේ. නිසි පුහුණුවක් ලැබූ ගුරුවරුන්ගේ ප්‍රතිශතය 97% ඉක්මවා ඇති අතර 19:1ක් වන පරිදි ඉහළ ම තලයේ සිසු ගුරු අනුපාතයක් ද පවතී. නමුත් එම පද්ධතියේ ඵලදායීතාවය ගැන අපට කිසි සේත් සතුටු විය නොහැකි ය. පළමුවන වසරෙන් පාසලට ඇතුළත්ව සාමාන්‍ය පෙළ සහතිකයක් හෝ ජීවන කුසලතාවක් නැති ව තමන් පරාජිතයන් ලෙස සිතාගෙන සමාජයට එක් වෙන තරුණ ප්‍රතිශතය සියයට පනහකට ආසන්න ය. ඒ අතර ම සාමාන්‍ය පෙළින් අනතුරුව උසස් පෙළ ද සමත් වූ තරුණ තරුණියෝ ආණ්ඩුවේ ආයතනයක අතුගාන රස්සාවක් හෝ ඉල්ලා දේශපාලන නායකයන් පස්සෙන් යති. විභාග සමත් ව හෝ අසමත් ව වත්මන් අධ්‍යාපනය තුළින් සමාජයට දායක කරන්නේ මෙවැනි ජීවිතය අසමත් වූ පරම්පරාවකි. සමාජය පුරා අසංයත බව, බෙලහීන බව හා දීන බව ප්‍රචලිත වෙමින් පවතී. එයට හේතු බීජය ද මේ අර්බුදකාරී අධ්‍යාපනයයි.

## අර්බුදයට හේතුව

අධ්‍යාපනයේ මෙම අර්බුදයට මූලික හේතුව වන්නේ අධ්‍යාපනයේ සාර්ථකත්වය යනු විභාග ජය ගැනීම පමණක්මය යන සමාජ සම්මතයයි. ඒ සම්මතය නිසා ම පාසැල යනු විෂය දැනුම පොවන නීරස තැනක් බවට පත් වී ඇත. දරුවකුගේ වටිනාකම විෂය දැනුම සඳහා ලිඛිත විභාගයකින් ලැබෙන ලකුණුවලට ලඝු වී ඇත.

## අර්බුදයේ නිවාරණය

අර්බුදයේ නිවාරණය යනු සෑම දරුවකුටම තම සහජ හැකියාවන් විකසිත කර ගැනීම තුළින් අභිමානවත් වූ ද අනාගත අභියෝග ජය ගැනීමට ශක්තියක් ඇති වූ ද යහපත් පුරවැසියෙකු ලෙස සමාජයට පිවිසීමේ හැකියාව ලබා දෙන සර්වාංගීය අධ්‍යාපනයකට අවස්ථාවක් ලබා දීම ය.

2013 වසර මුල සිට පවත්වන ලද ක්‍රියාමූලික පර්යේෂණයක හා ඒ සමගාමී ව අම්පාර කලාපයේ පාසල් පද්ධතියේ විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා දෙමාපියන් සමග කෙරුණු සංවාද මාලාවක ප්‍රතිඵලයක් ලෙස එළි දක්වන මෙම පොත් පෙළේ අරමුණ එවැනි සර්වාංගීය අධ්‍යාපනයක් සඳහා මං පෙත විස්තරාත්මක ව දක්වා ලීමයි. එම ක්‍රියා මූල පර්යේෂණ ක්‍රියාවලියට සහයෝගය දුන් පළාත් අධ්‍යාපන ලේකම් එන්. ඒ. ඒ. පුෂ්පකුමාර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ එම්.ටී.ඒ. නිසාම්, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ඩග්ලස් රණසිංහ, පළාත් ප්‍රාථමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ සී. බී. ටී. කුමාරිහාමි, අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ එම්.කේ.පී. සුනිල් ගුණතිලක, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂිකා එස්. ආර්. හසන්ති හා ප්‍රාථමික සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ජී.එච්. ප්‍රේමරත්න යන මහත්ම මහත්මීන්ටත්,අම්පාර කලාපයේ කොට්ඨාස අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන්, විදුහල්පතිවරුන් හා ප්‍රාථමික ගුරු භවතුන්ටත්, විශේෂයෙන් ම, එම පර්යේෂණය ක්‍රියාවලියේ ප්‍රධානත්වය දැරූ ප්‍රධාන පර්යේෂිකා ආචාර්ය සුජාතා ගමගේ මහත්මියටත්, මුළු ක්‍රියාවලිය සඳහා දැවැන්ත කැප කිරීමක් කළ යහපත් අධ්‍යාපනයක් සඳහා වූ ජනතා ව්‍යාපාරයේ උපාලි චන්ද්‍රසිරි මහතාටත් මගේ හෘදයාංගම ස්තුතිය මෙයින් පුද කරමි.

විදුහල්පතිවරුනි, ගුරුවරුනි, මෙම පොත් පෙළ පරිශීලනය කරමින් නිර්මාණශීලී ලෙස ඒවායේ අඩංගු උපදෙස් ක්‍රියාවට යොදන්න. අම්පාරෙන් පටන් ගෙන මුළු රටට ම ආදර්ශයක් වන සේ නැගෙනහිර පළාත පුරා ම ක්‍රියාත්මක වන අධ්‍යාපන පුනරුදයක නියමුවන් වන්න.

විමලවීර දිසානායක
නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍ය

# පළාත් අධ්‍යාපන ලේකම්තුමාගේ පණිවිඩය

නැගෙනහිර පළාත් අම්පාර අධ්‍යාපන කලාපයේ විදුහල්වල ප්‍රාථමික අංශයේ විධිමත් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන මෙම වැඩසටහන ගැන මම අතිශයින් සතුටට පත්වෙමි.

දෙමාපියන් විසින් තම දරුවන්ට විභාග කේන්ද්‍ර කර ගනිමින් විෂය දැනුම පමණක් ලබා දීමට නැඹුරු වීම තුළ සිදුවන ව්‍යසනය සුළුපටු නොවේ. දරුවන්ට තම ළමා කාලයේ දී, ප්‍රීතිය භුක්ති විඳීමට හා සාර්ථකත්වය අත්දැකීමට අවස්ථා සම්පාදනය කිරීම ඔවුන්ගේ පූර්ණ සංවර්ධනයට අතිශයින් වැදගත් බව අධ්‍යාපනඥයින් විසින් ද පෙන්වා දී ඇත.

අම්පාර කලාපය තුළ ක්‍රියාත්මක මෙම වැඩසටහන දරුවන්ට වඩා ප්‍රායෝගික හා එළිමහන් ස්ථානවල ප්‍රීතිය භුක්ති විඳිමින් සෘජු අත්දැකීම් ලබාගැනීමට අවස්ථා සලසා දෙන එකකි. මේ සඳහා විදුහල්පතිවරු හා ගුරුභවතුන් බලගතු කිරීම, දෙමාපිය දායකත්වය ලබාගැනීම වෙනුවෙන් ඔවුන් දැනුවත් කිරීම, මෙම පර්යේෂණ කණ්ඩායම විසින් කර ඇත. දරුවාට විෂය නිපුණතා ලබා දෙන අතර ම වඩා ප්‍රබල ලෙස පුද්ගල නිපුණතා හා පුරවැසි නිපුණතා ලබා දීමට ගත් මෙම උත්සාහය ඉතා අගය කරමි.

දිනපතා වර්ධනය වෙමින් සිදු වන සමාජ අපරාධ, මංකොල්ලකෑම්, ළමා අපචාරවල මූල බීජ සිඳලනු වස් ප්‍රාථමික අංශයේ සිට ම මේ සිදු කිරීමට යනුයේ දැවැන්ත සමාජ ශෝධන ක්‍රියාවලියකි.

දරුවන්ට ආත්ම ශක්තියෙන් හා ආත්ම අභිමානයෙන් යුතුව අනාගතයට පියමනින්නට අවස්ථා සම්පාදනය සඳහා මේ ගත් උත්සාහයේ දී මෙහි පුරෝගාමී වූ ගරු නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමා ඇතුළු දායක වූ සියලු දෙනාට ම මාගේ ගෞරවය සහ ස්තුතිය පුද කරමි.

එන්. ඒ. ඒ. පුෂ්පකුමාර
පළාත් අධ්‍යාපන ලේකම්

# පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

"ජාතික නිෂ්පාදනය සඳහා අවශ්‍ය නිපුණතා සහිත පරම්පරාවක් දායක කරවීම" යන නැගෙනහිර පළාත් අධ්‍යාපන දැක්ම වඩාත් සාක්ෂාත් කරනු පිණිස අම්පාර කලාපයේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය පිළිබඳව සතුට පළ කරමි.

ළමා මිතුරු පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් සෑම සිසුවෙකුට ම පාසල ප්‍රිය ජනක වීමත්, ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය සිසුන්ට ප්‍රීතිමත් හා තෘප්තිමත් ලෙස සිදු කිරීමත් ඇතුළු ව අනෙකුත් මානවලට අනුකූල අවශ්‍යතා සැපිරීමක් පළාත තුළ සිදුවෙමින් පවතී. එවැනි අවස්ථාවක ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ඇති මඟ පෙන්වීම්වලට අනුකූල ව සිසුන්ගේ නිර්මාණාත්මක චින්තනය, සමාජ කුසලතා හා පෞරුෂ ලක්ෂණ ගොඩ නැගීමට, හැඩගැස්වීමට අවශ්‍ය පසුබිම මෙම ක්‍රියාත්මක වැඩසටහන තුළින් වඩාත් ප්‍රබල ව ලබා දෙයි.

අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනයේ දී වඩා සාර්ථක වූ අත්දැකීම් හා යහපත් ව්‍යවහාර අන් විදුහල්වල ගුරුභවතුන්, විදුහල්පතිවරුන් හා බෙදා ගැනීම මෙම වැඩසටහන තුළ දැකිය හැකි යහපත් ලක්ෂණයකි. ගුරු ආකල්පවල දැඩි වෙනසක් සිදු කරමින් ප්‍රාථමික පන්ති කාමර ප්‍රීතිමත් හා සතුටින් පිරි මනසකින් යුතු කඩිසර ව දරුවන් ගැවසෙන පර්යේෂණාගාර බවට පත් කරමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී බලාපොරොත්තු වූ සැබෑ වෙනස ඇති කිරීමට ගන්නා වූ ව්‍යායාමයක් ලෙස මෙම වැඩ සටහන හඳුන්වා දෙමින්, මෙය ක්‍රියාත්මක කිරීමට කතිකාවතකට මුල පිරූ ගරු නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමාට අවශ්‍ය වූ සහය සහ මඟ පෙන්වීම නොඅඩුව ලබා දුන් නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්තුමාට ස්තුතිය පළ කරමි.

එම්.ටී.ඒ. නිසාම්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

# පළාත් ප්‍රාථමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ 1999 වර්ෂයේ පටන් මේ දක්වා ම ප්‍රාථමික අධ්‍යාපන කටයුතුවල නියැලෙමින් සිටින මා හට මෙම පර්යේෂණ කාර්යයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම භාග්‍යයක් ලෙස සැලකිය හැකි ය.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දී ඉගෙනුම් ක්‍රමවේද ලෙස හඳුන්වා දුන් සෙල්ලම් හා විනෝදජනක වැඩ හා ක්‍රියාකාරකම් යන අංශ දෙකට අඩු බරක් දී අසුන්ගත වැඩ වැඩි ප්‍රතිශතයකින් ක්‍රියාත්මක වීම සියලු ම අවධිවල දක්නට ලැබේ. නිදහසේ සිය කැමැත්තෙන් ම ඉගෙනීමට ද, ප්‍රායෝගික හා ප්‍රයෝජනවත් දේ ඉගෙනීමට ද, ජීවිතය සඳහා ඉගෙනීමට ද සිසුන් කෙසේ යොමු කළ යුතු ද? ඒ සඳහා ක්‍රමවේදය කුමක් ද? යන්න පිළිබඳ ව සෙවීමට මෙහි දී සියලු කණ්ඩායම් උත්සුක වූහ. ඒ සඳහා එළිමහන් ක්‍රියාකාරකම් වැඩිකිරීම කෙරෙහි අවධානය යොමු වූ අතර, සෙල්ලම් සැදෑව වැනි නිර්මාණාත්මක අංග ද එකතු කරන ලදී. එක් පරිසර තේමාවක් ගත් කල එය ශ්‍රේණි වශයෙන් ප්‍රසාරණය වී ඇති අයුරු අධ්‍යයනය කර සියල්ල එකට ඈඳීමට "පොදු හුයක්" සොයා ගැනීමට පර්යේෂණ කණ්ඩායම වෙහෙස වූහ. ගුරුවරු එකිනෙකා පරයමින් පරිසර අධ්‍යයන සන්ධාරයේ හරය උකහා ගෙන කමනීය ලෙස පන්ති කාමරයෙන් පිටත ක්‍රියාකාරකම් නිර්මාණය කිරීමේ නිරත වූහ.

හඳුන්වා දී ඇති තක්සේරු පත්‍රිකාවලට අමතරව සිසු ජර්නලයක් හා දෙමාපිය ජර්නලයක් මඟින්ද සිසුන් තක්සේරුකරණය කිරීම මෙහි දී සිදු වේ.

පර්යේෂණය මනා ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන තීරණ ගැනීමේ දී විද්වත්හු සහ ප්‍රායෝගික ක්‍රියාකරුවෝ එක් රැස් වී යෝජනා, තර්ක, විතර්ක සාකච්ඡා සම්මුතීන් මඟින් අප වෙත සහය ලබා දුන්හ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා තම මත ඉදිරිපත් කරමින් ද, අධ්‍යාපන ලේකම්තුමා අන් අයගේ අදහස්වලට ඉවසීමෙන් යුතුව සවන් දෙමින් ද, ගරු පළාත් අධ්‍යාපන අමාත්‍ය විමලවීර දිසානායක මැතිතුමා නිරතුරුව ම පාහේ යම් යම් තර්ක හෝ අනුමාන, ප්‍රතිවිරෝධී ප්‍රායෝගික උදාහරණ මඟින් සුණු විසුණු කරමින් හා ඇතැම් විට යහපත් භාවිතයන් ශාස්ත්‍රීය න්‍යායන් මඟින් තහවුරු කරමින් ද දැක්වූ දායකත්වය ඉතා අගය කරමි.

සී.බී.ටී. කුමාරිහාමි
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ

# අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

මිනිස් සමාජය මේ මොහොත දක්වා වෙනස් වූයේ වෙනසක් ප්‍රාර්ථනා කළ, ඒ ප්‍රාර්ථනාව මල්ඵල ගැන්වීමට ක්‍රියාත්මක වූ හා ඒ වෙනසට අනුව තම පැවැත්ම වෙනස් කරගත් අය නිසා ය.

ඉගෙනුමක අග්‍ර වූ ඵලය විය හැක්කේ වෙනස ඇතිවීමයි. ඒ වෙනස කොපමණ අගයකින් යුතුව මිනිස් සන්තානයක යහපතට හේතු වී ඇති ද යන්න අප ආපසු හැරී බැලිය යුතු කරුණක් බව වර්තමානය අපට බල කරයි.

අප හැබැවට ම ඉගෙන ගත් මිනිසුන් ද? වසර දහස් ගණනාවකට එපිට පරිණාමයට භාජනය වූ අප ම ද අද මේ සිටින්නේ යනුවෙන් සිතන තරමට ප්‍රශ්න කර ගැනීමට නොයෙක් ඉඟි සැපයෙමින් තිබෙන මොහොතක අම්පාර අධ්‍යාපන කලාපය කේන්ද්‍ර කර ගනිමින් නැගෙනහිරට වෙනස් ව නැගෙන්නට වෙනසක් ඇති කිරීමට ගරු නැගෙනහිර පළාත් අධ්‍යාපන ඇමති විමලවීරයන් පෙරටුගාමී විය. අපට ඒ මගෙහි අම්පාර කලාපයේ පාසල් 102 ගෙන යාමට විවිධ වූ අහුමුලු නිරාවරණය හා අනාවරණය කර ගනිමින් දැවැන්ත වූ විද්වත් පර්යේෂණ ක්‍රියාවලියකට විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, දෙමාපියන් පසුගිය වර්ෂය තුළ පෙළ ගැස්වීමට හැකි විය.

මේ වර්ෂය තුළ අප සූදානම් වන්නේ "සෑම දරුවකු ම ඔප කළ යුතු මැණිකකි" නම් වූ තේමා පාඨයට ගැළපෙන ලෙස මෙතෙක් ඔප දැමූ ක්‍රියාවලිය පාසල තුළ වෙනසකට ගෙන යාමටයි. සර්වාංගීය පිබිදීමකින් දරුවන්ගේ ජීවිතය සමත් කිරීමට අපට හැකි වූවොත් එය දිගාමඩුල්ලේ ආශ්චර්යය ම වනු ඇත.

"ලෝකයේ කොතැනක හෝ දරුවෙකු හඬන්නේ නම් සිනාසෙන අයට මම ශාප කරමි" යි ඉන්දීය මහා කවි භාර්තියාර් පැවසුවා සේ සෑම දරුවෙකුට ම සිනාසෙන හෙට දිනක් උදා කර අපි කොහේ සිට හෝ සැනසෙමු.

එම්.කේ.පී. සුනිල් ගුණතිලක
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
අම්පාර.

# ක්‍රියා මූල පර්යේෂණ කමිටු සභාපතිතුමාගේ පණිවිඩය

කෙතරම් වැරදි සහගත වුව ද, බියජනක වුව ද, පවතින හා හුරු-පුරුදු වූ දේවල් වෙනස් කිරීම පහසු කරුණක් නොවේ. අධ්‍යාපනය ද එසේ ම ය. වත්මන් අධ්‍යාපන ක්‍රියාදාමයේ නිර්මාපකයෝ ද, හිමිකරුවෝ ද, උරුමකරුවෝ ද, පෘතග්ජන මනුෂ්‍යයෝ ම වෙති. ගැඹුරු වෙනසක් දරා ගනිමින් ඊට සහභාගි විය හැක්කේ, ඔවුන් අතරින් ශික්ෂාකාමී ශ්‍රේෂ්ඨයන් සුළු පිරිසකට පමණි.

පවතින අධ්‍යාපන ක්‍රියාවලිය නිසා පීඩා විඳින සුවහසක් දනන් වුව ද පවතින දෙයට එරෙහිව හඬ නගනවා මිස ඉන් ඔබ්බට නොයති. එබැවින් විකල්පයක් ඉදිරිපත් කිරීම දුෂ්කර කාර්යයකි. විකල්පයක් ක්‍රියාවට නැංවීම අතිශයින් ම දුෂ්කර කාර්යයකි. වසර 200 කට අධික කාලයක් තිස්සේ ජීව විද්‍යාඥයන්, ස්වභාව විද්‍යාඥයන්, මනෝවිද්‍යාඥයන්, ස්නායු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් හා අධ්‍යාපනඥයන් විශාල පිරිසක් විසින් පවතින අධ්‍යාපන ක්‍රමය විද්‍යාත්මක ලෙස විග්‍රහ කර ඇත. විකල්පයන් ඉදිරිපත් කර ඇත.

විකල්පයන් ක්‍රියාවට නගමින්, පවතින දෙය වෙනස් කරමින්, ස්වභාවික වරනාත්මක ක්‍රියාවලියේ උපරිම තලය වෙත මානවයා කැඳවාගෙන යාමේ වගකීම ඔබ-අප බාර ගත යුතුව ඇත. මානව වංශ කතාවේ දිගහැරෙන ආත්මික ව සුපුෂ්පිත වූ ශ්‍රේෂ්ඨතම මානවයා නිර්මාණය කරමින්, අධ්‍යාත්මික යුගය වෙත පෘථිවි මානව පරම්පරාව ම කැඳවාගන යාමේ අභියෝගය දැන් අප විසින් භාර ගෙන තිබේ. සුවිශේෂී කුසලතා හඳුනා ගනිමින්, සංවර්ධනය කරමින්, විෂය නිපුණතාවලට ඔබ්බෙන් ඇති "සදාචාර මාලිගාවට" ගරුකරන පුද්ගල හා පුරවැසි නිපුණතා අගයමින්, තක්සේරු කරමින්, අම්පාර අධ්‍යාපන කලාපය තුළ උපදින සෑම දරුවකු ම ජීවිතයෙන් සමත්වන දරුවකු බවට පත්කරන "සර්වාංගික අධ්‍යාපන සංවර්ධන වැඩ සටහන" මේ වන විට පාසල් සියයක ම එක වර ක්‍රියාත්මක වීම ආරම්භ වී තිබේ.

මෙම ක්‍රියාවලියේදී මා දුටුවේ මහා පුදුමාකාර සංස්කෘතියකි. වන්දනීය වූ මානව සුන්දරත්වයකි. අදහාගත නොහැකි ලෙස මහා පිරිසක්, පවතින තත්වයන් යටතේ, එකාවන් ව එකට එකතුව උඩුගම් බලා පිහිනීමකි. බුදු දහමේ එන "ජාතක කතා" රචකයන්ගේ නිර්මාණ නොවේ නම්, "ඒවා සත්‍යම ම කතා නම්", මීට පෙරත් කවදා හෝ අපි එකට එකමුතු වී එකා මෙන් වීර්යය වඩමින් "බැරි වැඩ කර" ලොවට සෙත සැදුවේ යැයි මට හැඟේ.

දේශය තුළ වාර්ෂික ව ලක්ෂ තුනහමාරක් පමණ දරුවන්ගේ ජීවිතවලට ආලෝකයක් වන්නට ගරු නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යතුමා නායකත්වය දෙන විට, එයට නිසි බර තබමින් පළාත් ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය එය පැතුරුණු වැඩක් බවට පත්කළා ය. එය ගුණයෙන් හා හරයෙන් ගැඹුරු කරන්නට අම්පාර කලාපයේ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂතුමන් නායකත්වය දුන්නේ ය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය (පරිපාලන) ප්‍රමුඛ නිලධාරී මණ්ඩලය එතුමන්ට අවශ්‍ය රැකවරණය ද සහයෝගය ද ලබාදුන්හ. ගුරු උපදේශක මහත්ම මහත්මීන් පාසලෙන් පාසලට යමින් විදුහල්පති සහ ගුරු භවතුන්ගේ මහා වීර්යයට ශක්තියක් වූවෝය. ප්‍රධාන පර්යේශිකාවගේ මෙහෙයවීමෙන් වසරකට අධික කාලයක් ක්‍රියාමූල පර්යේෂණය සිදුවෙමින් පවතියි. මේ සියල්ල මෙසේ සිදු වූයේ මේ සියලු දෙනා යන්ත්‍රයක ඇති රෝද මෙන් නිසි පරිදි නිසි ලෙස ස්ථාන ගත වී වගකීමෙන් යුතුව තම කාර්යය භාරය ඉටු නොකරන්නට සිහිනෙන් වත් මෙම නව සංස්කෘතිය අම්පාර අධ්‍යාපන කලාපය තුළ උපත ලබන්නේ නැත.

ධනය, බලය, තිලය, රන්-රිදී, මුතු-මැණික් හා සුපිරි වාහන අගයමින්, මානවයාට තක්සේරුවක් ලබාදෙන යුගයක, තම කාලයත්, ශ්‍රමයත්, දැනුමත්, අමතර වැටුප් හෝ දීමනා නොලබා තම ධනය ම වැය කරමින්, දරුවන් හා මව්පියන් පිළිබඳ මහා කරුණාවෙන් දන් දුන් ඔබ සැබැවින් ම උතුමෝ වෙති. දේශයේ රාජ්‍ය සේවයට ඔබ මහත් ආදර්ශයකි. ඔබගේ දාන පාරමිතාවට ලැබෙන මහා ත්‍යාගයයි, උපත ලබා ඇති නව සංස්කෘතිය.

දරුවන්ට සතුට දෙන, මව්පියන්ට සැපය දෙන, රටේ ජාතික අරමුණු සපුරා ලීමට සමත් අනාගත පරපුරක් බිහිකරන, ''සර්වාංගික අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලිය'' නමැති, මේ කුළුදුල් දරුවා සමඟ උපත ලබා ඇති නව සංස්කෘති රැක බලා ගනිමින් පෝෂණය කිරීමට, ඔබ-අපට තවදුරටත් දැඩි ආයාසයක් දැරීමට සිදුවනු ඇත. ඊට අවශ්‍ය ම ශක්තිය ද

ධෛර්යය ද, වීර්යය ද, ප්‍රඥාව ද, වර්ධනය කර ගැනීමට සිදුවන බව ද, ඒ සඳහා අවැසි ලෙස කැපවන බවට ද ඔබ ඉදිරියේ ප්‍රතිඥා දීමටත් යහපත් අධ්‍යාපනයක් සඳහා වූ ව්‍යාපාරයේ අපි මේ මොහොත යොදා ගනිමු.

ඔබ අප එකතුව පෝෂණය කරන මේ නව සංස්කෘතිය ලොව පිළිගත් දෑ බවට පත් කිරීමට නම් අපගේ ක්‍රියාමූල පර්යේෂණය වහ-වහා නිම කළ යුතුව ඇත. එහි වාර්තාව ඔස්සේ අප ලැබූ ප්‍රතිඵල විද්‍යාත්මක ලෙස ලොවට දානය කළ යුතුව ඇත. ප්‍රමාණික බුද්ධිමතුන් විසින් අපගේ ප්‍රයත්නය අගය කළ යුතුව ඇත. එතෙක් අප තව දුර යා යුතුය.

උපාලි චන්ද්‍රසිරි
ගරු සභාපති, ක්‍රියාමූල පර්යේෂණ කමිටුව
ගරු සභාපති, යහපත් අධ්‍යාපනයක් සඳහා වූ ව්‍යාපාරය

# සර්වාංගීය අධ්‍යාපන මං පෙත පිළිබඳ හැඳින්වීමක්

ජාතික අරමුණු පිළිබඳ අවබෝධයක් ඇති, එම අරමුණු මුදුන්පත් කර ගැනීම පිළිබඳ අවබෝධයක් ඇති හා මුදුන්පත් කර ගැනීමට දායක විය හැකි, මුදුන්පත් කර ගැනීමට සුදුසු සමාජ සංස්කෘතීන් හා ආර්ථික රටාවන් ප්‍රතිනිර්මාණය කරගත හැකි අනාගත පරපුරක් සඳහා පදනම දැමීමට නූතන අධ්‍යාපන ක්‍රියාවලිය අසමර්ථ වී ඇත.

අධ්‍යාපන ගුණාත්මකභාවයේ නාය යාමට ප්‍රබල ම හේතුව වී තිබෙන්නේ ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය යි.

(අ) වාර අවසානයේ සහ වර්ෂ අවසානයේ පැවැත්වෙන පාසල් ඇගයීම් ද තක්සේරුකරණ ක්‍රියාවලීන් ද, ජාතික ඇගයීම් වන 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (සාපෙ) විභාගය හා අ.පො.ස. (උ:පෙ) විභාගය ජීවන නිපුණතා ඇගයීමකට වඩා විෂය දැනුම ඉලක්ක කර ඇත.

(ආ) දැනට ක්‍රියාත්මක ජාතික ඇගයීම් ද, පාසල් ඇගයීම් හා තක්සේරු ද ජාතික අරමුණු වෙත එළැඹීමට සමත් අනාගත පරපුරක් නිර්මාණය කිරීම සඳහා දක්වන සැලකිල්ල ප්‍රමාණවත් නොවේ.

(ඇ) ජාතික අරමුණු හා ඇගයීම් අතර ද, ජාතික අරමුණු හා තක්සේරු අතර ද ගොඩනගා ඇති පරස්පරය විසින් අධ්‍යාපන ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵලයේ ගුණාත්මකභාවය හීන කර ඇත.

(ඈ) විදුහල්පති හා ආචාර්ය මණ්ඩල විසින් ද, දරුවන් හා මව්පිය භාරකරුවන් විසින් ද අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සිදු කරමින් තිබෙන්නේ ඇගයීමට ලක් කරන හා තක්සේරු කරන දෙය බෙදා හදා ගැනීමයි.

(ඉ) ජාතික මට්ටමින් ඇගයීමට හා තක්සේරුවට ලක්කරන අවශ්‍යතාවන් බොහෝ දුරකට සපුරාලීම සඳහා ප්‍රමාණවත් සංවර්ධිත මට්ටමක් අපගේ ගුරු පරපුර සතුව ඇත.

(ඊ) අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පවත්වා ගනිමින්, ජාතික අරමුණු වෙත එළැඹීමට සමත් අනාගත පරපුරක් සඳහා පදනම දැමිය හැකි සර්වාංගික අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලියක් හා, ඊට සරිලන ක්‍රියාකාරී ඉගෙනුමක් සඳහා දරුවන් යොමුකිරීමට සමත් සම්පත්දායක ගුරුපරපුරක් ප්‍රතිනිර්මාණය කරගැනීම සඳහා, ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියේ ගැඹුරු වෙනසක් ඇතිකිරීම අත්‍යවශ්‍යය වී තිබේ.

## විසඳුම් හා යෝජනා

ජාතික අරමුණු වෙත එළැඹීමට සමත් අනාගත පරපුරක් ඉලක්ක කරමින් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දී ඇති විෂය නිර්දේශය ක්‍රියාකාරී ඉගෙනුමක් ලෙස දරුවන් සන්තක කිරීම සඳහා:

අ. ක්‍රියාකාරී ඉගෙනුමට බාධාවක් ව ඇති කළුලෑල්ල හා පන්ති කාමරය නමැති සිර කුටියෙන් දරුවා නිදහස් කිරීම.

ආ. එළිමහන් හා නිදහස් ඉගෙනුම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.

ඇ. විෂය සමෝධානිත, ශ්‍රේණි සමෝධානිත, නිපුණතා මත පදනම් වූ ඉගෙනුම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.

ඈ. ක්‍රියාකාරකම් මත පදනම් වූ සූදානම් සටහන් ද, නිපුණතා සටහන් ද, පසු විපරම් හා ප්‍රතිකාර්ය වැඩසටහන් ද සැලසුම් කිරීම.

ඉ. දරුවන්ගේ සුවිශේෂී ක්‍රියා දෙස ද, සුවිශේෂී කුසලතා දෙස ද, සුවිශේෂී දුබලතා දෙස ද අවධානය යොමුකිරීමට ගුරුවරයාට හැකියාව ලැබෙන පරිදි ක්‍රියාකාරකම් පවත්වාගෙන යෑම.

ඊ. ගුරු භවතුන් සාමූහිකව ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී මවුපියන් හා බාහිර සම්පත් දායකයින්ගේ ද පූර්ණ

සහභාගීත්වය ලබා ගැනීම සඳහා කටයුතු කිරීම.

උ. සම්භවන ඇගයුම් ක්‍රමවේදය විද්‍යාත්මකව හා විශ්වසනීය ලෙස සංවර්ධනය කිරීම සඳහා හඳුන්වා දී ඇති සිසු-දෙමාපිය වාර්තා නිසි ලෙස පවත්වා ගැනීම.

ඌ. ජාතික අරමුණු වෙත එළැඹීමට සමත් අනාගත පරපුරක් ප්‍රතිනිර්මාණය කිරීම ඉලක්ක කර ගනිමින් හඳුන්වා දෙනු ලබන තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලිය පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

එ. විෂය නිපුණතාවලට අමතරව පුද්ගල හා පුරවැසි නිපුණතාවලට 60% ක ඇගයීමක් ලබාදීම.

ඒ. පුද්ගල හා පුරවැසි නිපුණතාවලට නිසි තක්සේරුවක් ලබාදීම.

ඔ. වාර අවසාන හා වර්ෂ අවසාන ශිෂ්‍ය වාර්තා පොත මගින් පුද්ගල නිපුණතා, පුරවැසි නිපුණතා, විෂය නිපුණතා යන නිපුණතා සියල්ල ම නිසි ලෙස තක්සේරු කිරීම ඔස්සේ පුද්ගල හා පුරවැසි නිපුණතාවලට ද ඉහළ වටිනාකමක් ලබාදීම.

ඕ. නම්‍යශීලී කාලසටහනකට ද, සීමිත වාර්තාකරණයකට ද ගුරුභවතුන්ට අවශ්‍ය පහසුකම් සලසා දෙමින් දරුවන් පිළිබඳ තක්සේරු හා ඇගයීම් වාර්තා මත ගුරුවරයාට ඉහළ ඇගයීමක් ලබා දීම.

ඖ. මවු-පිය කමිටු ගොඩනැගීම.

## අපේක්ෂිත ප්‍රතිඵල

අ). ක්‍රියාකාරකම්වල ඵලදායීතාව මත අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ යාම.

ආ). කිසිදු තරගයකින් හෝ බලකිරීමකින් තොරව ම දරුවන්ගේ පාසල් පැමිණීම 100% දක්වා ඉහළ යාම.

ඇ). ක්‍රියාකාරී අධ්‍යාපන ක්‍රියාවලියක් සඳහා වන ප්‍රජා දායකත්වය 70% කට වඩා ඉහළ අගයක් ගැනීම.

ඈ). ගුරු භවතුන්ගේ සේවා දින ගණන වැඩිවීම, පාසල තුළ දිනයේ වැඩි කාලයක් රැඳීසිටීම, ක්‍රියාකාරකම් සැලසුම් කිරීම් ඇණවුමකින් තොර ව ම ප්‍රියමනාප ලෙස සිදුවීම.

ඉ). නීතිරීති මගින් බලහත්කාරයෙන් ගුරුවරුන් පාසල තුළ රඳවා ගැනීම අහෝසි වීම.

ඊ). පාසලේ පැවැත්මට හානිකර කණ්ඩායම් ගොඩනැගීම වෙනුවට එකමුතුකම හා සහෝදරත්වය හොඳින් පැවතීම.

උ). ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ඵලයක් ලෙස දරුවා නිවාස පරිසරය ද, සංස්කෘතිය ද වෙනස් කරන ප්‍රබල පෞරුෂීය වාහකයෙකු බවට පත්වීම.

ඌ). දරුවන්ගේ හා දෙමාපියන්ගේ ගුරුවරිය-මව-සොයුරිය බවට පත්වූ ගුරු භවතා පාසල් පෝෂක කලාපයේ ම ගෞරවාදරයට පාත්‍ර වන සංස්කෘතියක් නිර්මාණය කරන්නා හා මෙහෙයවන්නා බවට පත්වීම.

ඉ). පාසල් පෝෂක කලාපය මතින් තොර මත්ද්‍රව්‍යය අලෙවියෙන් තොර දූෂණ හා අපචාර වලින් තොර පොලීසියට වැඩ අඩු කලාපයක් බවට පත්වීම.

## ක්‍රියා මූල පර්යේෂණය

යහපත් අධ්‍යාපනයක් සඳහා වන ව්‍යාපාරය විසින් මීට පෙර සිදුකරන ලද අත්හදා බැලීම් හා අනාවරණ මත පදනම් ව සැකසුණ ඉහත යෝජනා හා විසඳුම් ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු ද, එම ගැටලු ඵලදායී ලෙස විසඳන

ආකාරය ද, ඒ සඳහා දැරිය යුතු යෙදවුම් ද, මේ සියල්ලේ ඵලයන් ලෙස සිදුවන නව වෙනස්වීම් ද, නිසි ලෙස පර්යේෂණයට ලක්කරමින්, පවතින මානව හා භෞතික සම්පත් ම යොදා ගනිමින් අදාළ වෙනස්කම් සිදු කරමින්, නැගෙනහිර පළාතේ අධ්‍යාපනයේ සාධනීය වෙනසක් සඳහා යොදා ගත හැකි විද්‍යාත්මක ප්‍රවේශයන් හා ප්‍රමිතීන් හඳුනා ගැනීම, 2013 වර්ෂය මුල සිට අම්පාර අධ්‍යාපන කලාපය කේන්ද්‍ර කර ගනිමින් කෙරෙන ක්‍රියා මූල පර්යේෂණයේ අරමුණයි. මෙම මං පෙත එම පර්යේෂණයේ ප්‍රතිඵලයකි.

# ක්‍රියා මූල පර්යේෂණ කමිටුව

අනුශාසනය
ගරු විමලවීර දිසානායක, අධ්‍යාපන අමාත්‍ය
එන්. ඒ. ඒ. පුෂ්පකුමාර, ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය
එම්.ටී.ඒ. නිසාම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
නැගෙනහිර පළාත

සභාපති
උපාලි චන්ද්‍රසිරි , යහපත් අධ්‍යාපනයක් සඳහා වූ ව්‍යාපාරය

උපදේශනය
ආරියරත්න අල්විස්, සහකාර ලේකම්, ජාතික අධ්‍යාපන කොමිසම
මහාචාර්ය සිරි හෙට්ටිගේ,කොළඹ විශ්ව විද්‍යාලය
ආචාර්ය පියදාස ගමගේ, තත්ත්ව කළමනාකරු, එක්සත් රාජධානිය
ආචාර්ය නිලාමනී ගිනිගේ, ජාතික අධ්‍යාපන ආයතනය (හිටපු)

පළාත් අධ්‍යාපන දෙපාර්මේන්තු සම්බන්ධීකරණය
ඩග්ලස් රණසිංහ, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
සී බී ටී කුමාරිහාමි, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන)

ප්‍රධාන පර්යේෂක
ආචාර්ය සුජාතා ගමගේ, ලර්න්ඒෂියා ආයතනය
+94 777 748 470; gamage@gmail.com

ක්‍රියාකාරී කමිටුව

- එම්. කේ. පී. සුනිල් ගුණතිලක, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ
- එස්. ආර්. හසන්ති, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන)
- සමීර සෝමරත්න, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්)
- ආර්. ජී. නලින් සංජීව, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන)
- කේ. ජී. මියුරින්, හිටපු සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික)
- ඩී. ඩී. කුමාරරත්න, කළමණාකරු, අම්පාර ගුරු පුහුණු මධ්‍යස්ථානය
- බී. එම්. බන්දුසේන, ගුරු උපදේශක
- ඊ. එල්. සුනිල්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ; ලතා අබේගුණවර්ධන, ගුරු උපදේශක වයි. ඒ. ප්‍රේමලතා, ගුරු උපදේශක (උහන කොට්ඨාසය)
- ජේ. එස්. යාපා, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ; එච්. ටී.ටී. කාන්ති, ගුරු උපදේශක ශාන්ත කරුණාරත්න, ගුරු උපදේශක (දමන කොට්ඨාසය)
- එම්. ආර්. ඩී. දසනායක, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ; එම්. එම්. එස්. මල්ලවාරච්චි, ගුරු උපදේශක (අම්පාර කොට්ඨාසය)
- එච්. අමරජීව, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ; ජයන්ත ප්‍රදීප් කුමාර, ගුරු උපදේශක (ලාහුගල කොට්ඨාසය)

කමිටු සම්බන්ධීකාරක
ජී. එච්. ප්‍රේමරත්න, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන)

# නැගෙනහිර පළාතේ අධ්‍යාපනය සඳහා යෝජිත පස් අවුරුදු සංවර්ධන සැලැස්ම

(සංක්ෂිප්තව)

තේමාව

"සැම දරුවෙකු ම ඔප කළ යුතු මැණිකකි"

දැක්ම

තමාට සුවිශේෂ වූ පෞරුෂත්වයකින් සවිමත්ව, සීග්‍රයෙන් වෙනස් වන ලෝකයක අභියෝග වලට මුහුණ දීමට ශක්තියක් ඇතිවූද, යහපත් පුරවැසියන් ලෙස සමාජයට ප්‍රවිෂ්ට විය හැකි වූද, තරුණ පරපුරක් බිහිකිරීම තුලින් ආසියාවේ ආශ්චර්යය බවට අප ශ්‍රී ලංකාව ස්ථාපිත කිරීමේ මහින්ද චින්තන ඉදිරි දැක්ම සාක්ෂාත් කරගැනීම.

අරමුණු

නැගෙනහිර පළාතේ අධ්‍යාපන පද්ධතියඃ

| | | |
|---|---|---|
| 1. | ගුණාත්මක වේ | ඵලදායී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් |
| 2. | සාධාරණ වේ | පාසල් යන වයසේ සෑම දරුවකුටම සම අධ්‍යාපන අවස්ථා |
| 3. | පහසුකම් සහිත වේ | සහනශීලී හා ඵලදායී වූ ඉගෙනුමක් සඳහා අවශ්‍ය ම වාතාවරණය හා පහසුකම් |
| 4. | ප්‍රජාවෙන් සවිමත් වේ | සවිය දෙන පාසල් ප්‍රජා සම්බන්ධතාවයන් |
| 5. | කාර්යක්ෂම වේ | හැකියාවෙන් හා කැපවීමෙන් සන්නද්ධ වූ අධ්‍යාපන ධූරාවලියක් |

ප්‍රධාන කාර්ය සාධන දර්ශක හා ඉලක්ක

ඉගෙනීමට සූදානම

1. පළාතේ දරුවන්ගෙන් සිසුන්ගෙන් 90% ක් වත්[1,2],පළමුවන ශ්‍රේණියට පිවිසිමේදී එම අදාළ ප්‍රවේශ නිපුණතා පෙන්වයි.

ඉගෙනීමේ යෙදීම

2. පළාතේ දරුවන්ගෙන් 90% ක් වත්[7] නිසි වයසට පාසලට ඇතුල් වී අනිවාර්ය අධ්‍යාපනයේ සමාප්තිය දක්වා ඉදිරියට යයි.

සාර්ථක ඉගෙනුම

3. එක් එක් ඉගෙනුම් අවධියට සරිලන(අ) සෙල්ලම් හා විනෝද ජනක ක්‍රියා (ආ) සැලසුම්ගත ක්‍රියාකාරකම් හා (ඇ) අසුන් ගත ක්‍රියාවන්ගේ සුදුසු සංකලනයක් තුලින් එම එක් එක් ඉගෙනුම් අවධීන්ට නිර්දේශිත සියලු <u>නිපුණතාවන්</u> වර්ධනය කර ගැනීමේ අවස්ථාව සෑම සිසුවෙකුට ම ලැබී ඇත.
4. පළාතේ පාසල් අධ්‍යාපනය ලබන සිසුන්ගෙන් 90% ක් වත් එක් එක් ඉගෙනුම් අවධිය සඳහා නිර්දේශිත ගණිතය හා මවුබස ඇතුළු <u>අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා</u> ලබාගෙන ඇත.
5. සෑම සිසුවෙක් සඳහා ම ඔහුගේ හෝ ඇයගේ ලැදියා හා රුචිකත්වයන් පිළිබිඹු කෙරෙන නිපුණතාවන් අවම වශයෙන් පහක්[7] හෝ දියුණු කර ගනිමින් ඒවායේ විශිෂ්ටයකු වීමේ අවස්ථාව ලැබී ඇත.මෙම නිපුණතාවන්ට අනිවාර්යෙන්ම පුද්ගල නිපුණතාවන් දෙකක් හා පුරවැසි නිපුණතාවන් එකක් ඇතුලත් විය යුතුය.

---

[1]පෙර පාසැල් අධ්‍යාපනය පිළිබඳ ඉලක්කය මේ අවස්ථාවේ පළාත් අධ්‍යාපන සැලැස්මට එකතු කළ යුතුද යන්න තව දුරටත් සාකච්ඡා කළ යුතුව ඇත.

[2]මෙහිදී දැක්වෙන 90% හෝ වෙනත් ඉලක්ක පිළිබඳව තව දුරටත් අධ්‍යනය කළ යුතුව ඇත.

[3]විශිෂ්ටයකු ලෙස මෙහි අදහස් කෙරෙන්නේ පන්තියේ හෝ වෙනත් ආශ්‍රේය කණ්ඩායමක් තුල යම් නිපුණතාවක් සඳහා විශේෂයක් පෙන්වන සිසුන් තුන් හතර දෙනෙකුගෙන් එක් අයෙකි..

# පටුන


1. සිසු ජර්නලය....................2

2. ගුරු-දෙගුරු පොත....................2

3. පන්ති වාර්තා පොත....................3

 3.1. පාසල් ලිත....................4

 3.2. පන්ති ලිත....................5

 3.3. පන්ති ප්‍රතිපත්ති හා ස්ථාවර ක්‍රියාකාරකම්....................6

 3.4. කාල සටහන....................10

 3.5. වාර සැලසුම හා දෛනික වාර්තාව....................12

 3.6. සුවිශේෂ නිපුණතා තක්සේරු පත්‍රිකාව....................26

4. දෛනික සැලසුම් හා ප්‍රත්‍යාවේක්ෂණ පොත....................28

5. අධ්‍යාපන සාධන වාර්තා....................29

 5.1. ප්‍රත්‍යෙක වාර්තා පොත....................29

 5.2. නිපුණතා සාධන ගොනු....................29

 5.3. ශිෂ්‍ය වාර්තා පොත....................29

 5.4. ශිෂ්‍ය වාර්තා පොත සඳහා ආකෘතිය....................30

6. තත්ත්ව තහවුරුකරණය....................31

 6.1. තත්ත්ව තහවුරු දෙසතිය....................31

 6.2. තත්ත්ව තහවුරු ක්‍රම වේදය....................31

 6.3. තත්ත්ව නිර්ණායක....................31

  (1) නිර්දේශිත සැම නිපුණතාවන් ලබා ගැනිමේ අවස්ථාව....................32

  (2) අත්‍යාවශ්‍ය නිපුණතාවන් පිළිබඳ ප්‍රවීනත්වය....................33

  (3) එක් එක් සිසුවාගේ පෞරුෂය/ස්වීයත්වය හඳුනා ගැනීම හා වර්ධනය කිරීම....................34

## 3. සිසු ජර්නලය

සිසු ජර්නලය යනු තම ඉගෙනුම පිළිබඳ ව හා පාසලේ, ගෙදර දී හා මග තොට දී ලැබෙන අත්දැකීම් පිළිබඳ ව ස්වයං සටහන් තබා ගැනීමට සිසුවාට ලැබෙන ඉඩ ප්‍රස්තාවකි. සිසු ජර්නලය තුළින් සිසුවාගේ ඉගෙනීම වඩා හොඳින් අධීක්ෂණය කිරීමට ගුරුවරයාට ද අවස්ථාවක් ලැබේ. මෙම ජර්නලය සාර්ථකවීමට නම් අසුන් ගත ක්‍රියා හා ඒ ආශ්‍රිත ව ගුරුවරයා විසින් කළු ලෑල්ලේ ලියන දේ ළමයා විසින් සටහන් පොතේ ලියා ගැනීමේ ගතානුගතික ක්‍රමයෙන් බැහැර විය යුතුය.

"මා ඉගෙන ගත් දේ" හා "මගේ සිතුවිලි" යන කොටස් දෙකක් සිසු ජර්නලයේ අඩංගු විය යුතුය.

"මා ඉගෙන ගත් දේ" පිළිබඳ සටහන් (දිනපතා)[1]

ක්‍රියාකාරකම් මුල් කරගත් ඉගැන්වීම් ක්‍රමයේ කොටසක් ලෙස සෑම ක්‍රියාකාරකමකට ම පසු කණ්ඩායමක් ලෙස එම ක්‍රියාකාරකම පිළිබඳ ප්‍රත්‍යාවේක්ෂණ සාකච්ඡාවක් පවත්වා ඉන් අනතුරුව එක් එක් සිසුවාට තම සිසුනට එම ක්‍රියාකාරකම් පිළිබඳ තමාට වැටහුණු දේ ලියා දැක්වීමට අවස්ථාවක් ලබා දිය යුතුය.

මෙම සටහන් චිත්‍ර, කවි, වාක්‍ය හෝ රචනා හෝ ඒවායේ සම්මිශ්‍රණයක් විය හැකිය.

2013 මුලදී අපට ලැබුණු ජර්නල්වල වැඩි හරියක් පන්තියේ දී මේ මේ විෂයන් ඉගැන්වූ බව වාර්තා කිරීමට සීමා වී තිබිණි. ආරම්භයක් ලෙස එහි වරදක් නැත. නමුත් ටිකෙන් ටික දරුවන්ට ඉන් ඔබ්බට ගොස් මතකය, අවබෝධය, භාවිතාව, නිර්මාණය හා ඇගයීම යන බ්ලූම්ගේ ඉගෙනීමේ අවස්ථා වලට යාමට මෙම ජර්නල උපකාරි විය හැකි බව සලකන්න.

කිසි විටක ජර්නලයේ අකුරු හෝ ව්‍යාකරණ නිවැරදි කිරීම නොකළ යුතුය. ළමයා දිරි ගැන්වීම හෝ තව දුරටත් ගවේෂණයට යොමු කරන ප්‍රතිචාර පමණක් කිරීම මැනවි. උදාහරණ ලෙස අද අපි කුරුලු වර්ග 7 ක් ගැන ඉගෙන ගත්තා කියා ලියා තිබුණොත් එම වාක්‍යයේ පැත්තකින් ''මොනවාද ඒ කුරුල්ලෝ ?'' කියා අසන්න පුළුවන. සිසුවා කුරුලු වර්ග නම් කර තිබුණොත් ''ගෙදරත් ඒ කුරුල්ලෝ ඉන්නවාද?'' කියා අසන්න පුළුවන. (අකුරු හෝ ව්‍යාකරණ ඉගැන්වීම සඳහා කාල සටහනේ වෙනත් අසුන්ගත ක්‍රියා අවස්ථාවක් යොදා ගන්න.:

''මගේ සිතුවිලි'' (සතියකට වරක් හෝ වැඩි ගණනක්)[1]

පාසලේ ඉගෙනගත් දේට අමතරව සිසුවාගේ හැඟීම් හෝ නිර්මාණාත්මක අදහස් එම සිසු ජර්නලයේ ම සටහන් කිරීමට සතියකට වරක් වත් අවස්ථාවක් දෙන්න. මේ සඳහා ජර්නලයේ අවසන් පිටු කිහිපයක් වෙන් කර ගත හැක.

## 2. ගුරු දෙගුරු පොත

2013 වර්ෂයේ දී දෙමාපියනට/භාරකරුවනට නිර්දේශ කෙරුණු දෙමාපිය ජර්නලය යනු ගුරුවරයාට හා දෙමාපියනට හෝ භාරකරුවනට දරුවා පිළිබඳ පූර්ණ වැටහීමක් ලබා දීම සඳහා යොදා ගත හැකි ප්‍රබල මෙවලමකි. ඒ තුළින් තම දරුවා කෙරෙහි දෙමව්පියනගේ/භාරකරුවන්ගේ අවධානය වඩා විධිමත් ව යොමු කරවිය හැකිය. දරුවාගේ ගෙදර ජීවිතය හොඳින් තේරුම් ගැනීම තුළින් ගුරුවරයාට ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය වඩා සඵල කර ගත හැකිය.

එම ජර්නලය වඩා සාර්ථක කර ගැනීම සඳහා දෙමාපිය/භාරකරු ජර්නලය ගුරු දෙගුරු පොත ලෙස නම් කර පහත සඳහන් ලෙස පවත්වා ගෙන යන්න.

- දෙමාපියන්/භාරකරුවන්විසින් මෙම ගුරුදෙගුරු පොත සෑම දිනකම සිසුවා අත පාසලට එවිය යුතුය.

---

[1] ක්‍රියාකාරකමකට පෙර සූදානමක් හෝ හැදින්වීමක් ලෙසට සිසුනට යම් සටහන් දීමක් කිරීමට සමහර විට අවශ්‍ය වනු ඇත.

- එම ජර්නලයේ සතියකට වරක් වත් සටහනක් තබන ලෙස ගුරුවරයා විසින් දෙමාපියන්/භාරකරුවන් උනන්දු කළ යුතුය. දෙමාපියන්ගේ/භාරකරුවන්ගේ සහභාගිත්වය ගුරුවරයාගේ සාර්ථකත්වය පිළිඹිඹු කරයි.
- ගුරුවරයා විසින් සතියකට වරක් වත් එම ගුරු දෙගුරු පොත පිරික්සිය යුතුය.
- එම ගුරු දෙගුරු පොත පහත සඳහන් කොටස්වලින් සමන්විත විය යුතුය.
  - සිසුවාගේ ජීව දත්ත (පිටු 2 කින් , අමතර පිටුව වෙනස්කම් සටහන් කිරීම සඳහා යොදා ගන්න)
  - පාසලට නොපැමිණීම් වාර්තා කිරීමේ වගුව (පිටු 2 ක් හෝ 3 ක් යොදා ගන්න. දිනය, නොපැමිණීමට හේතුව, දෙමාපිය/භාරකරු අත්සන, ගුරුවරයාගේ අත්සන දක්වන්න)
  - දරුවාගේ ගෙදරදී සාමාන්‍ය දින චරියාව විස්තර කිරීමේ පිටුව (පාසැල පවත්වන දින පහේදී හා සති අන්තය පිළිබඳ වෙන වෙනම සඳහන් කළ යුතුය, සෑම වසරක් මුල දී ම මෙම පිටුව අලුත් විය යුතුය.)
  - දෙමාපියන්/භාරකරුවන් දරුවා පිළිබඳ කරන සති සටහන (ඉතිරි පිටු)ඃ සතිය තුළ දරුවාට ගෙදර දී ලැබුණු විශේෂ අත්දැකීම්, පෙන්වන ලද සුවිශේෂී දක්ෂතා, දඟකාර වැඩ ඇති නම් මෙහි සඳහන් කළ හැකිය. ගෙදරින් පාසලට(ගුරුවරයාට) යොමු විය යුතු කරුණු දැක්වීමට ද එම ජර්නලය යොදා ගත හැකිය. වාර්තා කිරීමට කිසිත් නැති අවස්ථා ද තිබිය හැක. දෙමාපියන්ට/භාරකරුවන්ට අකුරු බැරි නම් වාචිකව හෝ විස්තරයක් දෙන ලෙස ඉල්ලා සිටින්න.
  - ගුරුවරයාගේ සටහන්ඃ දෙමාපිය/භාරකරු සටහනට පසු අවශ්‍ය නම් ගුරුවරයාට ප්‍රතිචාරයක් දිය හැකිය. විශේෂ ක්‍රියාකාරකම් පිළිබඳව ගෙදරට පණිවිඩයක් යැවීමට ද මෙම පොත යොදා ගත හැකිය.
  - දැනටමත් ගුරුදෙගුරු අදහස් හුවමාරුව සඳහා පැවැත්වෙන පන්ති කව හා මෙම ගුරුදෙගුරු පොත එකිනෙකට ශක්තියක් කර ගන්න.

අවම වශයෙන් එකොළොස් වන ශ්‍රේණිය දක්වා පවත්වා ගෙන යන මෙවැනි සටහන්, පන්ති කව හා වෙනත් අන්තර්ක්‍රියා හරහා පාසැල හා ගෙදර අතර තොරතුරු හුවමාරුව සාර්ථකව කිරීම තුළින් දෙමාපියනට හෝ භාරකරුවනට හා ගුරුවරුනට එකතුව සිසුවාගේ අධ්‍යාපනය නිසි මගට යොමු කළ හැකි වනු ඇත.

## 3. පන්ති වාර්තා පොත

පාසල් ලිත, පන්ති ලිත, පන්ති ප්‍රතිපත්ති හා ස්ථාවර ක්‍රියාකාරකම්, කාල සටහන, වාර සැලසුම හා දෛනික වාර්තාව හා සුවිශේෂ නිපුණතා තක්සේරු පත්‍රිකාව ලෙස කොටස් 8 කින් සමන්විත වේ.

එක් එක් ගුරුවරයා විසින් පාසලේ ලිත අනුසාරයෙන් තම පන්තිය සඳහා පන්ති ලිතක් සාදා ගත යුතුය (3.1 කාණ්ඩ 3.2 කොටස් බලන්න). මෙම ලිත සෑදීමේ දි වර්ෂය තුළ කිරීමට බලාපොරත්තු වන පරිසර හා ආගම තේමාවන්, ප්‍රජා සත්කාර, වගකීම්, ස්ථාවර ක්‍රියාකාරකම් හා විශේෂ ක්‍රියාකාරකම් ලෝකයේ, රටේ, පළාතේ, කලාපයේ හා පාසලේ සිදු කිරීමට (අනුස්මරණය කිරීමට) නියමිත වෙනත් ක්‍රියාකාරකම් සමඟ උචිත ලෙස සමපාත කරගන්න. බුද්ධාගම පාඩම යටතේ ආගමික වතාවත් කිරීම හා වෙනත් පන්ති ප්‍රතිපත්ති සැලසුම් කර මෙහි සටහන් කරන්න. අපට කළ හැකි වෙනස්කම් පරිසර තේමාව යටතේ වසර පුරා කෙරෙන ප්‍රජා සත්කාරයක් පටන් ගැනීම හා ගෙවත්ත සැලසුම් කිරීම හා පටන් ගැනීම පළමුවන වාරයේ ම කිරීම වඩා සුදුසුය. පළමුවන වාරයට යෙදෙන ඉස්ලාම්, හින්දු හා බෞද්ධ ආගමික උත්සව හා නිදහස් උත්සවය සමඟ අපි ලක්වැසියෝ පාඩම සම්බන්ධ කර ගත හැකිය.

පන්ති ප්‍රතිපත්ති හා ස්ථාවර ක්‍රියාකාරකම්, කාල සටහන, වාර සැලසුම හා දෛනික වාර්තාව හා සුවිශේෂ නිපුණතා තක්සේරු පත්‍රිකාව සඳහා වැඩිවිස්තර 3.3-3.6 කොටස් වලින් දැක්වේ.

## 3.1.පාසල් ලිත

| වාරය | සති # | සතිය | පාසල් ලිත |
|---|---|---|---|
| 1 | 1 | ජන 02-05 | පළමුවන වාරය පටන් ගැනීම (ජන 02); පළමුවන ශ්‍රේණියේ සිසුන් පිළිගැනීමේ උත්සවය |
| | 2 | ජන 06-12 | |
| | 3 | ජන 13-19 | මිලා-දුන්-නබි, තයිපොංගල් (14); දුරුතු පෝය (15); |
| | 4 | ජන 20-26 | ආරක්ෂාව පිළිබඳ වැඩ සටහන (උදා) |
| | 5 | ජ27-පෙ02 | |
| | 6 | පෙබ 03-09 | නිදහස් උත්සවය (04)/සෙල්ලම් දිනය (උදා) |
| | 7 | පෙබ 10-16 | නවම් පෝය (14); |
| | 8 | පෙබ 17-23 | |
| | 9 | පෙබ24-මා 02 | මහා සිව රාත්‍රී දිනය (27); ක්‍රීඩා උත්සවය/සෙල්ලම් දිනය (උදා) |
| | 10 | මා03-මා 09 | |
| | 11 | මා10-16 | මැදින් පෝය (16) |
| | 12 | මා17-23 | ලෝක ජල දිනය (22) |
| | 13 | මා24-30 | තත්ත්ව තහවුරුව/තත්ත්ව කව |
| | 14 | මා31-අප්‍රි06 | තත්ත්ව තහවුරුව/තත්ත්ව කව; අවුරුදු උත්සවය/සෙල්ලම් දිනය (4) |
| | 15 | අප්‍රි 07-08 | පළමුවන වාරයේ අවසන් දිනය (8) |
| | | අප්‍රි 09-20 | අවුරුදු නිවාඩුව; අවුරුදු (13-14); බක් පෝය/සිරිපා සමයේ අවසන (14); මහ සිකුරාදා (18); පාස්කු (20) |
| 2 | 1 | අප්‍රි 21-27 | |
| | 2 | අප්‍රි 28-මැයි 04 | |
| | 3 | මැයි 05-11 | ලෝක කම්කරු දිනය (මැයි 1); වෙසක් සූදානම/සෙල්ලම් දිනය (උදා) |
| | 4 | මැයි 12-18 | පාසැල් වෙසක් උත්සවය; වෙසක් පෝය (මැයි 14/15 ) |
| | 5 | මැයි 19-25 | |
| | 6 | මැයි 26-ජූනි 01 | ලෝක දුම්වැටි විරෝධී දිනය (30) |
| | 7 | ජූනි 02-08 | ලෝක පරිසර දිනය (ජූනි 5)/සෙල්ලම් දිනය (උදා) |
| | 8 | ජූනි 09-15 | පොසොන් පෝය (ජූනි 12) |
| | 9 | ජූනි 16-22 | |
| | 10 | ජූනි 23-29 | මත්ද්‍රව්‍ය විරෝධී දිනය (26) |
| | 11 | ජූනි 30-ජූලි06 | |
| | 12 | ජූලි 07-13 | ලෝක ජනගහන දිනය (11); ඇසළ පෝය (12) |
| | 13 | ජූලි 14-20 | තත්ත්ව තහවුරුව/තත්ත්ව කව |
| | 14 | ජූලි 21-27 | තත්ත්ව තහවුරුව/තත්ත්ව කව |
| | 15 | ජූලි28-අගෝ01 | ඉඩ්-උල්-ෆිටර් හෝ රාමසාන් (29); වාරාවසාන දිනය (අගෝ 01) |
| | අගෝ02-අගෝ 31 | | අගෝස්තු නිවාඩුව; නිකිණි පෝය (10); ශිෂ්‍යත්ව විභාගය (17) |
| 3 | 1 | සැප් 1-7 | තුන්වන වාරය පටන් ගැනීම (සැප් 01) |
| | 2 | සැප් 08-14 | බිනර පෝය (08); සෙල්ලම් දිනය |
| | 3 | සැප් 15-21 | |
| | 4 | සැප් 22-28 | ලෝක සාම දිනය (21) |
| | 5 | සැප් 29-ඔක් 05 | කියවීමේ මාසය; සෙල්ලම් දිනය/ලෝක ළමා දිනය (1) ඉඩ්-උල්-අධා (5); සෙල්ලම් දිනය |
| | 6 | ඔක් 06-12 | ලෝක ගුරු දිනය, වප් පෝය (8) |
| | 7 | ඔක් 13-19 | ලෝක ආහාර දිනය (16) |
| | 8 | ඔක් 20-26 | දීපාවලි (ඔක් 22) |
| | 9 | ඔක්27-නො02 | සෙල්ලම් දිනය (උදා) |
| | 10 | නොවැ 03-09 | ඉල් පෝය (6) |
| | 11 | නොවැ 10-16 | |
| | 12 | නොවැ 17-23 | තත්ත්ව තහවුරුව/තත්ත්ව කව |
| | 13 | නොවැ 24-30 | තත්ත්ව තහවුරුව/තත්ත්ව කව |
| | 14 | දෙසැ 1-05 | වාරාවසාන දිනය (5); |
| | දෙසැ 06-ජන | | නිවාඩු කාලය; උඳුවප් පෝය/සිරිපා සමය පටන් ගැන්ම (6); නත්තල් (25) |

## 3.2.පන්ති ලිත

| වාරය | සති # | සතිය | පන්ති ලිත | පරිසර තේමාව | ආගම තේමාව |
|---|---|---|---|---|---|
| 1 | 1 | ජන 02-05 | | | |
| | 2 | ජන 06-12 | | | |
| | 3 | ජන 13-19 | | | |
| | 4 | ජන 20-26 | | | |
| | 5 | ජ27-පෙ02 | | | |
| | 6 | පෙබ 03-09 | | | |
| | 7 | පෙබ 10-16 | | | |
| | 8 | පෙබ 17-23 | | | |
| | 9 | පෙබ24-මා 02 | | | |
| | 10 | මා03-මා 09 | | | |
| | 11 | මා10-16 | | | |
| | 12 | මා17-23 | | | |
| | 13 | මා24-30 | | | |
| | 14 | මා31-අප්‍රි06 | | | |
| | 15 | අප්‍රි 07-08 | | | |
| අප්‍රි 08-20 | | | අවුරුදු නිවාඩුව | | |
| 2 | 1 | අප්‍රි 21-27 | | | |
| | 2 | අප්‍රි 28-මැයි 04 | | | |
| | 3 | මැයි 05-11 | | | |
| | 4 | මැයි 12-18 | | | |
| | 5 | මැයි 19-25 | | | |
| | 6 | මැයි 26-ජූනි 01 | | | |
| | 7 | ජූනි 02-08 | | | |
| | 8 | ජූනි 09-15 | | | |
| | 9 | ජූනි 16-22 | | | |
| | 10 | ජූනි 23-29 | | | |
| | 11 | ජූනි 30-ජූලි06 | | | |
| | 12 | ජූලි 07-13 | | | |
| | 13 | ජූලි 14-20 | | | |
| | 14 | ජූලි 21-27 | | | |
| | 15 | ජූලි28-අගෝ01 | | | |
| අගෝ 02-31 | | | අගෝස්තු නිවාඩුව | | |
| 3 | 1 | සැප් 1-7 | | | |
| | 2 | සැප් 08-14 | | | |
| | 3 | සැප් 15-21 | | | |
| | 4 | සැප් 22-28 | | | |
| | 5 | සැප් 29-ඔක් 05 | | | |
| | 6 | ඔක් 06-12 | | | |
| | 7 | ඔක් 13-19 | | | |
| | 8 | ඔක් 20-26 | | | |
| | 9 | ඔක්27-නො02 | | | |
| | 10 | නොවැ 03-09 | | | |
| | 11 | නොවැ 10-16 | | | |
| | 12 | නොවැ 17-23 | | | |
| | 13 | නොවැ 24-30 | | | |
| | 14 | දෙසැ 1-05 | | | |
| දෙසැ 06-ජන | | | දෙසැම්බර් නිවාඩුව: නත්තල් (24) | | |

## 3.3. පන්ති ප්‍රතිපත්ති හා ස්ථාවර ක්‍රියාකාරකම්

පන්ති ප්‍රතිපත්ති හෝ ස්ථාවර ක්‍රියාකාරකම් හඳුනා ගෙන ඒවා වඩා සංවිධානාත්මක ලෙස කර ගැනීම තුළින් ප්‍රාථමික සිසුවනට ලබා දිය යුතු බොහොමයක් පුද්ගල හා පුරවැසි නිපුණතා පහසුවෙන් ම ලබා දීමට ගුරුවරුනට හැකි වනු ඇත. උදාහරණ ලෙස ප්‍රාථමික ශ්‍රේණි 1-5 හි මවු බස සඳහා වූ විෂය මාලාවන්හී සඳහන් වන පරිදි:

> පන්ති කාමරය තුළ සිදුවන ගුරු-සිසු අන්තර් ක්‍රියා සහිත ඉගෙනුම් අවස්ථා පමණක් සිසුන්ගේ භාෂා වර්ධනයට ප්‍රමාණවත් නොවේ. භාෂා වර්ධනය ඉලක්ක කර ගත් වැඩ සටහන් රාශියක් පාසල තුළ ක්‍රියාත්මක විය යුතුය. එසේ ක්‍රියාත්මක කළ හැකි වැඩ සටහන් කිහිපයක් (විෂය නිර්දේශයේ) දැක්වේ. මේවා පාසල් හා පන්ති ප්‍රතිපත්ති වශයෙන් සැලසුම් ක්‍රියාවට නැංවීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ.

එම අදහස් තව දුරටත් විෂය මාලාවේ සියලු නිපුණතා අන්තර්ග්‍රහණය වනසේ දියුණු කර ගැනීම සඳහා උපදෙස් මාලාවක් පහත දැක්වේ..

පන්ති ප්‍රතිපත්ති යනු යම් පන්තියක සිසුන් විසින් කණ්ඩායමක් ලෙස හෘදයාංගමව ඉටු කෙරෙන චර්යාවකි. මෙම ප්‍රතිපත්තිය කුමක් වන්නේද යන්න එක් එක් පන්තියේ හෝ පන්තිය තුළ කණ්ඩායම් වල සාමූහික තේරීම වන්නේ නම් වඩාත් හොඳ ය. උදාහරණ ලෙසඃ

- පන්තියක් හැටියට අනන්‍යතාව පෙන්වන ප්‍රතිපත්තියක් ඇත. (උදාහරණ ලෙස ''අප පන්තියේ අපි සැම පොහොයකට ම පෙර දින සුදු මලක් රැගෙන පාසලට එන්නෙමු'')
- සැම සිසුවකුටම පන්තියේ පිරිසිදු කම, පිළිවෙළ හා අලංකරණය හෝ වෙනත් දෙයක් පිළිබඳ පුද්ගලික වගකීමක් ඇත.
- පන්තියක් හැටියට හෝ පන්තියේ කණ්ඩායම් හැටියට වගකීම් එකක් හෝ වැඩි ගණනක් ඇත.
  - පන්තියක් හෝ පන්තියේ කණ්ඩායම ලෙස පාසලේ යම් වපසරියක හෝ ස්ථානයක පිරිසිදු කම, පිළිවෙළ හා අලංකරණය පිළිබඳ වගකීම භාර ගෙන ඒ ගැන ක්‍රියාත්මක වීම.
  - ගෙවත්තක්, ඖෂධ උයනක් හෝ සතුන්ට කෑම දෙන ලෑල්ලක් වැනි දේ පවත්වා ගැනීම
  - පාසල අවට ගැවසෙන බලු බළලුන් ඇතුළු සතුන්ගේ සුව දුක් සොයා බැලීම
  - යම් යාන්ත්‍රික හෝ තාක්ෂණික සේවයක යෙදීම (උදාහරණ ලෙස යම් පන්තියක් විසින් තම පරිහරණය සඳහා ඉස්කුරුප්පු නියනක් සපයාගෙන පාසලේ ඩෙස්ක් පුටු ගේට්ටු ආදිය නිසි පරිදි පවත්වා ගෙන යාමට දායක වීමට ඉදිරිපත් වීමට පුළුවන.)
  - මාසිකව හෝ වාරිකව කෙරෙන ගිලානෝපස්ථානය වැනි ප්‍රජා සත්කාරයකට සහභාගී වීම

ස්ථාවර ක්‍රියාකාරකම් යනු පන්ති ප්‍රතිපත්ති හෝ පන්තියේ හෝ පාසලේ වෙනත් අවශ්‍යතා සඳහා වසරකට, වාරයකට, මාසයකට, සතියකට හෝ දිනකට වරක් නිශ්චිත දිනයක හෝ යම් කාල පරාසයක් තුළ කෙරෙන ක්‍රියාකාරකම් ය.

උදාහරණ ලෙසඃ

දවසේ පෙර සූදානමඃ එක් එක් පන්තිය විසින් පාසැල පටන් ගැනීමට පෙර කාලය තුළ සාමූහිකව තෝරා ගත් යම් නිශ්චිත පටිපාටියක් පිළිපැදිය හැක. උදාහරණයක් ලෙස එම කාලය සංවිධානාත්මක ලෙස පන්තිය හා පන්තිය අවට පිරිසිදු කර ගැනීමට යොදා ගත හැක. එම කාලය තුළ සිසුන් සුපරීක්ෂණය කිරීම පිළිබඳව විදුහල්පති හා සාකච්ඡා කර තීරණයක් ගත යුතුය..

උදෑසන රැස්වීමඃ දනටමත් සැම පාසලකම පාහේ උදෑසන රැස්වීම යනු විෂය දැනුමට අමතරව පුද්ගල හා පුරවැසි නිපුණතා ලබාදෙන අවස්ථාවක් ලෙස යොදා ගෙන ඇත. එක් එක් පන්තිය හෝ පන්තියේ කණ්ඩායමක් මගින් ඉටු කෙරෙන වගකීම හෝ සත්කාරයන් පිළිබඳව නිවේදන කිරීමටද උදෑසන රැස්වීම යොදා ගත හැකිය.

උදෑසන සාකච්ඡාව: උදෑසන ප්‍රවෘත්ති, පෙර දවසේ දී පාසලේ හෝ ගෙදර විශේෂ සිදුවීම් පිළිබඳ වාර්තා කිරීම හා සාකච්ඡාව සඳහා මෙහෙයුමක් දිනපතා ක්‍රියාත්මක කිරීම තුළින් අන්තර්-පුද්ගල සබඳතා, සන්නිවේදනය, තොරතුරු ලබා ගැනීම, කණ්ඩායමක් තුළ අදහස් බෙදා ගැනීම වැනි පුද්ගල නිපුණතා රාශියක් වර්ධනය නිරායාසයෙන් ම සිදු කර ගත හැක.

කෑම වේලාව: අපේ ආහාර යන පරිසර තේමාව පිළිබඳ නිපුණතා නිරන්තර අත්දැකීම් තුළින් ප්‍රගුණ කිරීම සඳහා දිනපතා ආහාර වේල අවස්ථාවක් කරගන්න. (උදාහරණ ලෙස ටෝට්ටෝ චාං පොතේ ''මුහුදු අහර ගොඩ අහර'' පරිච්ඡේදය බලන්න).

කතන්දර/ගී/රංගන/වාදන/නිර්මාණ විරාමය: මවුබස විෂය මාලාවේ නිර්දේශ කෙරෙන පරිදි පන්ති පුස්තකාල භාවිතය, පොත් පත් සඟරා හුවමාරුව, චරිතාරෝපිත කතා, භූමිකා රංගන, රංගන හා රූපණ, නිර්මාණාත්මක ලේඛන, පද්‍ය/ගද්‍ය නිර්මාණ, චිත්‍ර, කාටූන් චිත්‍ර, නිසදැස් සංකල්පනා සහිත බිත්ති පුවත් පත හෝ නිර්මාණ පැදුර ආදී කටයුතුවල යෙදීමට සතියකට නිශ්චිත කාල වේලා කිහිපයක් යොදා ගන්න. මෙම කටයුතු හැකිතාක් දුරට සතියේ ආවරණය කිරීමට බලාපොරොත්තු වන භාෂා, පරිසර හා වෙනත් නිපුණතා සමග ගළපා ගන්න.

එළිමහන් විරාමය: සෑම දිනක ම මිනිත්තු 15 ක් හෝ වැඩි විරාමයක් ලබා ගෙන තම තමන්ගේ වගකීම් හෝ ප්‍රජා සත්කාරය ඉටු කිරීමට හෝ ගෙවත්තේ හෝ ඔසු උයනේ පැළෑටි හා ගස් වර්ග, වත්තට යන එන කුරුල්ලන්, කුරුලු කෑම ලෑල්ල, පාරේ යන එන වාහන, එදිනෙදා අහස, කාලගුණය හා ආදි තෝරාගත් ස්වාභාවික ස්ථානයක් හෝ සංසිද්ධියක් කෙරේ නිදහසේ අවධානය යොමු කිරීමට සිසුනට අවස්ථාවක් දෙන්න. සමහර සිසුන් ඉදි කිරීම් වැඩ, යාන්ත්‍රික වැඩ හෝ තාක්ෂණික කටයුතුවල යෙදීමට වඩා කැමැත්තක් දක්වන්නේ නම් ඒ සඳහා අවශ්‍ය බඩු මුට්ටු හා මෙවලම් පවත්වා ගෙන යාමට සුදුසු ටෙක් කාමරයකී හෝ වෙනත් ඉඩක් සිසුනට ලබා දෙන්න. මෙම විරාමය පාසල පටන් ගැනීමට පෙර හෝ පසුව විය හැකිය.

ගවේෂණ/නිරීක්ෂණ චාරිකා: පැයක් හෝ ඊට වැඩි කාලයක් යොදාගෙන දෙසතියකට වරක්වත් නිරීක්ෂණ/ගවේෂණ චාරිකාවක් කරන්න. මේ සඳහා පාසල් වත්තේ ම එක් එක් සීමා, අසල ඇළ හෝ වැව, පාර අයින හෝ කඩ මණ්ඩිය ද අවස්ථානුකූලව තෝරා ගන්න. මෙහි දී පැළෑටි හා ගස් වැල්, අප අවට සිටින සත්තු, ආරක්ෂාව හා පරිස්සම, ගෙවත්ත, මිනිස් හැසිරීම්, පොළොව හා අහස, අපේ යහ පැවැත්ම හා වෙනත් පරිසර තේමා වලින් අවස්ථානුකූල ව ලබා දිය හැකි දැනුම හෝ නිපුණතා තෝරා ගන්න. අදාළ දෙසතිය සඳහා තෝරා ගත් පරිසර තේමාවට මෙම චාරිකාවල දී වැඩි අවධානයක් දිය හැකිය.

ප්‍රජාසත්කාර: පන්තියක් හැටියට තෝරා ගත් ප්‍රජා සත්කාරයක්/සත්කාරයන් සඳහා නිශ්චිත කාල පරාසයක් යොදා ගන්න. මෙය එළිමහන් විරාමය හෝ දවසේ පෙර සූදානම යන අවස්ථා

සෙල්ලම් සැන්දෑව: ගුරුවරුන් හා සිසුන් ක්‍රීඩා ඇඳුමෙන් හෝ පහසු ඇඳුමකින් සැරසී තුන් යම සිහිනය පොතේ ''සෙල්ලම් සැන්දෑව'' වැනි හෝ වෙනත් සැහැල්ලු ක්‍රියාකාරකම් වලින් පිරුණු දිනයක් හෝ සැන්දෑවක් මසකට වරක් සංවිධානය කරන්න. මෙහිදී ද එම මාසය සඳහා තෝරා ගත් පරිසර තේමාවලට වැඩි අවධානයක් දෙන්න. දැනටමත් ගුරුඅත්පොත් වල නිර්දේශ කර ඇති විවිධ ප්‍රසංග, ප්‍රදර්ශන, සිගිති පොළ, ආගමික හා සංස්කෘතික වැඩ සටහන්, ළමා සාහිත්‍යය මාසය අළලා සෙල්ලම් සැන්දෑව සංවිධානය කර ගත හැක.

2013 වර්ෂයේදී යහපත් අධ්‍යාපනය සඳහා වූ ව්‍යාපාරය මගින් වෙහෙරගල හා පාදාගොඩ පාසල්වලදී අත්හදා බලන්නට යෙදුන ''රෑ කඳවුර'' සංකල්පය මෙහිදී ආදර්ශයට ගත හැකිය. මෙවැනි රෑ කඳවුරු සඳහා පාඩම් සැලැස්ම සැකසීමේ දී පොළොව හා අහස තේමාවෙන් මෙන්ම සත්තු, අපේ අතීත විත්ති, වැඩ පහසු කරන මං යනාදී විවිධ තේමා වලින් අපේක්ෂිත නිපුණතා එක් කර ගත හැකිය. පිහිනුම් තටාක නැතුවාට

අම්පාරේ සිසුනට මසකට වරක් යාබද ඇළේ හෝ වැවේ සාමූහික ව ජල ක්‍රීඩා කිරීමේ අවස්ථාවක් ලබා දීම ගැන ද කල්පනා කළ මැනවි.

මේ සෑම ක්‍රියාකාරකමක් ම ළමා මිතුරු හා ළමා කේන්ද්‍රීය විය යුතුය. ප්‍රභූන් එක් කරගෙන පවත්වන සංකීර්ණ උත්සව නොවිය යුතුය. සැන්දෑ උත්සවයක් නම් සාමාන්‍යයෙන් රාත්‍රි 7-8 න් ඔබ්බට දික් නොවිය. යුතුය. ගුරුවරුනට හා දෙමාපියන්ට අනවශ්‍යය ලෙස මෙවැනි ක්‍රියාකාරකම් සවස 1-7 දක්වා කාලය තුළ පැවැත්වීම හෝ වෙනත් වෙනස්කම් සඳහා විදුහල්පතිවරයා විසින් කලාප අධ්‍යක්ෂ වරයා දැනුවත් කරමින් ක්‍රියාත්මක වනු ඇත.

වෙනත් ක්‍රියාකාරකම්: ලීලානන්ද ගමාච්චිගේ 'හරි පුදුම ඉස්කෝලේ' පරිවර්තනය හෝ දඹානේ ගුණවර්ධනයන්ගේ ''තුන් යම සිහිනය'' පොත ආශ්‍රයෙන් හෝ වෙනත් මූලාශ්‍රක යොදා ගෙන වෙනත් ක්‍රියාකාරකම් සැලසුම් කර ගත හැකිය.

පන්ති ප්‍රතිපත්ති හා ස්ථාවර ක්‍රියාකාරකම් සංවිධානය කර ගැනීමට පහත දැක්වෙන ආකෘති යොදා ගන්න. වසර පුරාම අවශ්‍ය ලෙස ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් එක් කර ගන්න. විදුහල්පතිවරයා හා පාසලේ තත්ත්ව කවය සමග ඒ අදහස් බෙදා ගන්න. යම් කරුණු වාර්ෂික ලිතේ ද සඳහන් වූවත් මෙම සටහන පූර්ණ කිරීම සඳහා නැවත ඒවා මෙහි සඳහන් කරන්න. මෙම ආකෘතින්ට අවශ්‍යය පමණින් තවත් පේළි එකතු කර ගන්න.

පන්ති ප්‍රතිපත්ති

| ප්‍රතිපත්තිය | විස්තරය | ලබා දෙන නිපුණතාවන් (අංක සහිතව) |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

ස්ථාවර ක්‍රියාකාරකම්-වාර්ෂික

| ක්‍රියාකාරකම | විස්තරය | ලබා දෙන නිපුණතාවන් (අංක සහිතව) |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

ස්ථාවර ක්‍රියාකාරකම්-වාරික

| ක්‍රියාකාරකම | විස්තරය | ලබා දෙන නිපුණතාවන් (අංක සහිතව) |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

ස්ථාවර ක්‍රියාකාරකම්-සතිපතා

| ක්‍රියාකාරකම | විස්තරය | ලබා දෙන නිපුණතාවන් (අංක සහිතව) |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

ස්ථාවර ක්‍රියාකාරකම්-දෛනික

| ක්‍රියාකාරකම | විස්තරය | ලබා දෙන නිපුණතාවන් (අංක සහිතව) |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

## 3.4. කාල සටහන

ප්‍රාථමික අධ්‍යාපනයෙන් අපේක්ෂිත නිපුණතා වැඩි කොටසක් ඉගැන්වීමෙන් නොව ප්‍රීතිය දනවන සෙල්ලම්, සැලසුම්ගත ක්‍රියා හා අසුන්ගත් ක්‍රියාවන්හි සුදුසු සංකලනයක් ලෙස අත්දැකීම් තුළින් ලබා දිය යුතු ඒවා ය. එම නිසා ප්‍රාථමික අවධියේ කාල සටහන සකස් විය යුත්තේ විෂයයන් අනුව නොව ක්‍රියාකාරකම් අනුව ය

1. වසර මුලදී ම එක් එක් ගුරුවරයා විසින් විදුහල්පතිවරයා හා පාසලේ තත්ත්ව කවය හා සාකච්ඡා තුළින් තම පන්තිය සඳහා පොදු කාල සටහනක් සාදා ගත යුතුය.

2. දැනට පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන විෂය මූලික කාල සටහනට සිර නොවී විෂය මාලාවෙන් අපේක්ෂා කෙරෙන නිපුණතා පාදක හා ක්‍රියාකාරකම් මුල් කරගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ප්‍රධාන කර ගනිමින් ඔබගේ කාල සටහන සාදා ගන්න.

3. එම කාල සටහනට හැකිතාක් දුරට පන්ති ප්‍රතිපත්ති හා ස්ථාවර ක්‍රියාකාරකම් එකතු කර ගැනීමෙන් සිසුනට පුද්ගල හා පුරවැසි නිපුණතාවන් නිරායාසයෙන් ලබා දීමේ අවස්ථාව සලසා ගන්න.

4. අසුන් ගත ක්‍රියා තුළින් අවධානය ලබා දිය යුතු ගණිතය හා මවුබස විෂය ඒකකයන් සඳහා නිශ්චිත කාල වේලාවක් යොදා ගත හැක. ශරීර සුවතාව සඳහා ද එසේම කාලච්ඡේදයක් වෙන් කර ගන්න.

5. පරිසරය හා ආගම විෂයන් ඉගැන්වීම හා ඉගෙනුම සම්පූර්ණයෙන් ම සෙල්ලම් හා සැලසුම්ගත ක්‍රියාකාරකම් හරහා සිදු විය යුතුය. අසුන් ගත ක්‍රියාවන් එම සෙල්ලම් හා ක්‍රියාකාරකම් සඳහා පෙර සූදානම හෝ ප්‍රත්‍යාවේක්ෂණයට සීමා විය යුතුය. ඉංග්‍රිසි හා දමිළ ගුරුවරුන් එම පෙර සූදානමට , ක්‍රියාකාරකම් වලට හෝ ප්‍රත්‍යාවේක්ෂණයට සුදුසු ලෙස සහභාගී කර ගත යුතුයි. එවැනි සෙල්ලම් හා සැලසුම්ගත ක්‍රියාකාරකම්වලට පහත සඳහන් අංග හෝ වෙනත් නිර්මාණශීලී අංග එකතු කර ගන්න.

   - කතන්දර/ගී/රංගන/වාදන/නිර්මාණ/රසාස්වාද විරාමය එළිමහන් විරාමය
   - ගවේෂණ/නිරීක්ෂණ චාරිකා
   - ප්‍රජාසත්කාර
   - සෙල්ලම් සැන්දෑව
   - වෙනත් ක්‍රියාකාරකම්

6. ගුරු අත්පොත්වල සතියක කාල පරාසයක් සඳහා නිර්දේශ කර ඇති කාලච්ඡේදයන් (එනම් මවුබස, පැ5; ගණිතය, පැ 5; පරිසරය, පැ 6; ඉංග්‍රිසි, පැ3; දෙවන භාෂාව, පැ1; ආගම, පැ2; උදය රැස්වීම හා ආගමික වතාවත්, පැ1 මි15; විවේක කාලය, පැ1 මි40; ශරීර සුවතාව, පැ2 මි05; විෂය සමගාමී ක්‍රියාකාරකම්, මි30) ඔබගේ එක් එක් සතියේ කාල සටහන සැදීම සඳහා ආධාර කර ගන්න.

7. පාසලෙන් පිට නිරීක්ෂණයක් සඳහා යාම හෝ වෙනත් විශේෂිත ක්‍රියාකාරකම් පිළිබඳ ව විදුහල්පතිවරයා දැනුවත් කිරීම ගුරුවරයාගේ වගකීමයි.

8. අවස්ථානුකූල ව සතියේ කාල සටහනේ යම් යම් වෙනස්කම් අවශ්‍ය නම් අංශ ප්‍රධානී හෝ විදුහල්පතිවරයා දැනුවත් කරමින් එම වෙනස්කම් කිරීම කළ යුතුය.

9. සෑම සතියක් හෝ දෙසතියක් සඳහාම තම පොදු කාල සටහන ආශ්‍රයෙන් පාඩම සැලසුම් කර ගත යුතු ය.

ආදර්ශ කාල සටහන (උදාහරණයක් ලෙස පමණි.)

| කාලච්ඡේදය | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| 1<br>7:00-7:30 | සූදානම* | | | | |
| 2<br>7:30-8:00 | උදෑසන රැස්වීම* | | | | |
| 3<br>7:30-8:00 | සුහද සාකච්ඡාව* | | | | |
| 4 | ශරීර සුවතාව | ශරීර සුවතාව | ශරීර සුවතාව | ශරීර සුවතාව | ශරීර සුවතාව |
| 5 | ගණිතය | ගණිතය | ගණිතය | ගණිතය | ගණිතය |
| 6 | මවු බස | මවු බස | මවු බස | මවු බස | මවු බස |
| 7 | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් |
| 8 | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් | සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් |
| 9 | ප්‍රත්‍යාවේක්ෂණය හා පසු දිනට සූදානම* | | | | |

*අවශ්‍ය ලෙස සෙල්ලම් හෝ සැලසුම්ගත ක්‍රියාකාරකම් සඳහා මුළු දවසක් හෝ දවසෙන් කොටසක් ඇතුළු වන ලෙස දෛනික පාඩම් සැලසුම සකසා ගත හැක. ගණිතය හෝ මවු බස පාඩම් එම ක්‍රියාකාරකම් සඳහා පෙර සූදානම් ලෙසද යොදා ගත හැක.

පන්ති කාල සටහන

| කාලච්ඡේදය | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

## 3.5. වාර සැලසුම හා දෛනික වාර්තාව

අම්පාර කලාපයේ ප්‍රාථමික පාසල්වල ගුරුවරුන් වන ඔබ හැකි තරම් 'ලිපිකාර' වැඩ වලින් නිදහස් කර ඔබගේ පූර්ණ අවධානය නිපුණතා පාදක, ශිෂ්‍ය කේන්ද්‍රිය, ක්‍රියාකාරකම් මුල් කර ගත් හා විෂය සමෝධානිතව කෙරෙන සර්වාංශික අධ්‍යාපන සංවර්ධනයක් කෙරෙහි යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම මෙම පන්ති වාර්තා ආකෘතියේ අරමුණයි.

දැනට ශ්‍රී ලංකාවේ පාසැල් පද්ධතියේ පොදු භාවිතයට අනුව වාර සටහන යනු වර්ෂය තුළ නිම කළ යුතු විෂය ඒකකයන් වර්ෂයේ වාර තුන හරහා උචිත ලෙස බෙදා දක්වන සටහනකි. සාමාන්‍යයෙන් එවැනි සටහනකට අවශ්‍ය කාල පරාසය, යෝජිත ආරම්භක දිනය හා අවසන් කරන දිනය ද ඇතුළත් වේ.

දෛනික වාර්තාව හෝ පන්ති වාර්තාව යනු එක් එක් දිනයේ දී ගුරුවරයා විසින් ආවරණය කරන ලද විෂය ඒකකයන් පිළිබඳ වාර්තාවකි. එයට විෂය ඒකකය හා අනු ඒකක සමග ආරම්භක වෙලාව හා අවසන් කරන වෙලාව ඇතුළත් වේ.

එම පන්ති වාර්තාව පහසුවෙන් සැකසීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිර්දේශිත විෂයමාලාවේ අඩංගු සියලූ නිපුණතාවන්හි සංයුතියක් ගුරු අත්පොත් ආශ්‍රයෙන් සකස්කර ඔබට මෙහිදී ලබා දේ. පළාතේ අධ්‍යාපන කාර්ය සාධන ඉලක්ක පිළිබිඹු වන ලෙස මෙම සංයුතිය පුද්ගල, පුරවැසි හා විෂය නිපුණතා යන පුළුල් වර්ගීකරණය යටතේ සංවිධානය කෙරුණු පුද්ගල නිපුණතා කාණ්ඩ 20 කින් ද පුරවැසි නිපුණතා කාණ්ඩ 4 කින් ද විෂය නිපුණතා කාණ්ඩ 7 කින් ද සමන්විත වේ. මෙම සංයුතිය යොදා ගැනීමෙන් වාර සටහන හා පන්ති වාර්තා පොත යනු දෙකක් නොව එකම සටහනක් ලෙස සකසා ගත හැක.

පුද්ගල හා පුරවැසි නිපුණතා

පුද්ගල හා පුරවැසි නිපුණතාවන් බොහොමයක් පාසල් හෝ පන්ති ප්‍රතිපත්ති තුළින් පාසල් ජීවිතයේ කොටසක් ලෙස ලබා දීම වඩා යෝග්‍යය වේ. එම නිසා වාර සැලසුමක් ලෙස එවැනි පුද්ගල හෝ පුරවැසි නිපුණතාව ඉදිරියෙන් අදාළ පන්ති ප්‍රතිපත්තිය සඳහන් කරන්න (උදාහරණ ලෙස වාරික ප්‍රතිපත්ති අංක 2). එක් එක් නිපුණතාව වර්ධනය කිරීම සඳහා පන්ති ප්‍රතිපත්ති තුළින් හෝ වෙනත් විෂය සමෝධානික ක්‍රියාකාරකම් තුළින් වාරයකට දෙවරක්වත් ඔබගේ අවධානය යොමු විය යුතුය. එසේ අවධානය යොමු කිරීමට හැකි වූ දිනයන් මෙහි දක්වන්න.

විෂය නිපුණතා

විෂය නිපුණතා සඳහා ආකෘතියේ 'සැලසුම' තීරුවේ එක් එක් වාරයේ තමා ආවරණය කිරීමට බලාපොරොත්තු වන නිපුණතා සඳහා වර්ෂය මුල දී තිතක් තබන්න. එසේ සම්පූර්ණ කරන ලද සැලැස්ම ඔබ විදුහලේ අංශ ප්‍රධාන හෝ විදුහල්පතිට ලබා දී ඇති 'විදුහලේ පිටපතට' ද එක් කරන්න. සෑම දවසක් අවසානයේ ම ආරම්භ කරන ලද නිපුණතා හා ආවරණය කෙරුණු නිපුණතා සඳහා පිළිවෙළින් 'ඇරඹුම'හා 'අවසන' තීරු වල අදාළ දිනය දමන්න. එම සටහන් විදුහලේ පිටපතට ද එදින ම එක් කරන්න.

වාර සැලසුම් හා දෛනික වාර්තා පවත්වා ගැනීම සඳහා නිපුණතා සංයුක්තය

මෙහි දැක්වෙන පුද්ගල හා පුරවැසි නිපුණතාවන් කට්ටලය ප්‍රාථමික ශ්‍රේණි පහම සඳහා නිර්දේශිත අත්‍යාවශ්‍ය හා පොදු නිපුණතාවන්ගේ සංකලනයකි. තරුවකින් ලකුණු කර ඇත්තේ අත්‍යවශ්‍යය නිපුණතාවයන් ය. සමහර නිපුණතාවන් ඔබගේ පන්තියට අදාළ නොවනු ඇත. අනික් අතට ඔබ විසින් මෙතෙක් සාර්ථක ව ප්‍රගුණ කරවන ලද යම් නිපුණතාවන් මෙම ජාතික අධ්‍යාපන ආයතනයෙන් නිර්දේශිත නිපුණතා සංයුක්තයේ අඩංගු නොවනු ඇත. එම අවස්ථාවන්හී දී ඔබගේ පාසලේ තත්ත්ව කවය හා අදාළ ගුරු උපදේශකවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරු ව ඔබ විසින් වසරේ ආවරණය කිරීමට බලාපොරොත්තු වන පුද්ගල හෝ පුරවැසි නිපුණතාවන් අවශ්‍ය ලෙස අඩු වැඩි කර ගැනීමට පන්ති භාර ගුරුවරයා ලෙස ඔබට අවකාශය ඇත.

පුද්ගල නිපුණතා

| නිපුණතාව | අදාළ ප්‍රතිපත්තිය හෝ ස්ථාවර ක්‍රියාකාරකම | 1 වන වාරය | | 2 වන වාරය | | 3 වන වාරය | |
|---|---|---|---|---|---|---|---|
| 1-යහ පැවැත්ම (විනයගරුක/ආගමානුකූල /ආචාරශීලී/ගුණගරුක) | | | | | | | |
| පාසලේදී කරන ආගමික වතාවත්වලට සංවරව සහභාගී වෙයි* | | | | | | | |
| නිසි සූදානමකින් යුක්ත ව නිවැරදි ව ආගමික වතාවත්වල යෙදෙයි | | | | | | | |
| තම ආගමට අනුව පැවතිය යුතු වන්දනා ක්‍රම අනුගමනය කරයි* | | | | | | | |
| ජාතික කොඩියට හා පාසල් කොඩියට අභිමානයෙන් යුතු ව ගරු කරයි* | | | | | | | |
| පාසල් ධජය කෙරෙහි ගෞරවාන්විත ව හැසිරෙයි | | | | | | | |
| නිවැරදි ඉරියව්වෙන් සිටිමින් ජාතික ගීය අභිමානයෙන් යුතු ව ගායනා කරයි* | | | | | | | |
| ගුරුවරුන්ට ගෞරව කරයි. ආචාරශීලී ව කතා කරයි | | | | | | | |
| පන්තියට පැමිණෙන අමුත්තන් කෙරෙහි ආචාරශීලී ව හැසිරෙයි | | | | | | | |
| අවස්ථානුකූල ව ආචාරශීලී ව කතා බහ කරයි. හැසිරෙයි* | | | | | | | |
| උදවු අවශ්‍ය අවස්ථාවල නොපැකිල ව ඉදිරිපත් වෙයි* | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 2-සාධනීය පැවැත්ම (පිරිසිදු කම/පිළිවෙළ/ආරක්ෂා වීම) | | | | | | | |
| පෞද්ගලික පිරිසිදුකම ගැන සැලකිලිමත් ව කටයුතු කරයි | | | | | | | |
| හිස, දත්, නිය පිරිසිදුව තබා ගනියි | | | | | | | |
| ආහාර ගැනීමට පෙර අත් පිරිසිදු කර ගනියි* | | | | | | | |
| පාසලට පැමිණෙන විට ඇඳුම් පිළිවෙළකට ඇඳගෙන එයි | | | | | | | |
| තමන්ගේ පොත පත ගරු සරු ඇතිව භාවිතා කරයි | | | | | | | |
| පරිහරණය කරන ලද උපකරණහා ද්‍රව්‍ය නිසි තැන තබයි* | | | | | | | |
| ශරීරය සමබර ව තබා ගෙන ඇවිදියි* | | | | | | | |
| සිට ගැනීමේ, ඉඳ ගැනීමේ හා ඇවිදීමේ නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි* | | | | | | | |
| පොලොවට අඩියක් පමණ ඉහළින් තිරස්ව තබන ලද දණ්ඩක් මත සමබර ව ඇවිදියි* | | | | | | | |
| පෞද්ගලික ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙයි | | | | | | | |
| පාරේ පයින් ගමන් කිරීමේ දී දකුණු පසින් ගමන් කරයි* | | | | | | | |
| රෝගවලින් ආරක්ෂා වීම සඳහා නිවැරදි පිළිවෙත් අනුගමනය කරයි* | | | | | | | |
| භාවිතයට ගන්නා උපකරණ පරිහරණය කරමින් නිසි තැන තබයි* | | | | | | | |
| භාවිතයට ගන්නා උපකරණ ආරක්ෂාකාරීව පරිහරණය කරමින් නිසි තැන තබයි* | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වැඩක් අවසානයේ උපකරණ හා ස්ථානය පිරිසිදු කරයි | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 3-පුද්ගලාන්තර සබඳතා | | | | | | | |
| ඉවසීමෙන් යුතු ව අන් අයට සවන් දෙයි | | | | | | | |
| කතා බහේ දී ප්‍රිය වචන භාවිතා කරයි | | | | | | | |
| සිය අදහස් සහනශීලී ව ප්‍රකාශ කරයි | | | | | | | |
| අන් අයත් සමග සුහද ව කතා බහ කරයි | | | | | | | |
| අන්‍යයන් කෙරෙහි සහානුභූතිකව කටයුතු කරයි | | | | | | | |
| පාසලේ කටයුතු වලදී අන්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි | | | | | | | |
| අන්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි | | | | | | | |
| තමන්ගේ දේ මෙන් ම අන්‍යෝන්ගේ දේ ද අගය කරයි | | | | | | | |
| අන්‍යයන්ගේ හැකියා හා යහගුණ අගය කරයි | | | | | | | |
| අන්‍යයන්ට උදවු කිරීමට කැමැත්තක් දක්වයි | | | | | | | |
| සුහද ලෙස අන්න්‍යන්ගෙන් උදවු ලබා ගනියි | | | | | | | |
| අන්‍යයන්ට උදවු කිරීමට කැමැත්තක් දක්වයි | | | | | | | |
| උදවු අවශ්‍ය අවස්ථා හැඳින ගෙන උදවු කරයි | | | | | | | |
| අන්‍යයන් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි* | | | | | | | |
| එදිනෙදා අවශ්‍යතා සඳහා ගුරුවරුන් හා සිසුන් සමග සුහද ව කතා බහ කරයි* | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 4-සන්නිවේදනය | | | | | | | |
| එදිනෙදා පන්ති කාමරයේ ලැබෙන විධානවලට ප්‍රතිචාර දක්වයි | | | | | | | |
| පන්ති කාමරය තුළ ගුරුවරයා විසින් දෙනු ලබන සරල වාචික උපදෙසක් (කරුණු දෙකක් අඩංගු) අනුව ක්‍රියා කරයි* | | | | | | | |
| තමා අසා ඇති කතන්දරයක් අනුපිළිවෙළින් පැහැදිලි ව පන්තිය ඉදිරියේ කියයි* | | | | | | | |
| තොරතුරු ක්‍රමානුකූල ව වාර්තා කරයි | | | | | | | |
| අත්දැකීමක් හෝ දුටු සිද්ධියක් හෝ අනුපිළිවෙළින් ප්‍රකාශ කරයි* | | | | | | | |
| ඇසූ පණිවිඩයක් නිවැරදි ව ලියා ගනියි* | | | | | | | |
| දුටු සිද්ධියක් පැහැදිලි ව විස්තර කරයි* | | | | | | | |
| නිවේදනයට සවන් දී වැදගත් කරුණු අවබෝධ කර ගෙන පවසයි* | | | | | | | |
| පුවත්පත් ගුවන් විදුලිය හා රූපවාහිනිය මගින් ලබා ගන්නා ආරංචි පන්තියේ ප්‍රකාශ කරයි | | | | | | | |
| මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවලින් ලබා ගන්නා ආරංචි පිළිබඳ තම මතය ප්‍රකාශ කරයි | | | | | | | |
| සන්නිවේදන මාධ්‍ය භාවිතයෙන් ලබා ගන්නා කාලීන තොරතුරක් ඉදිරිපත් කරයි* | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 5-ක්‍රීඩා | | | | | | | |
| සරල නීති රීති අනුගමනය කරමින් ක්‍රීඩාවල යෙදෙයි | | | | | | | |
| ඇවිදීම, දිවීම්, පැනීම් ආශ්‍රිත ක්‍රීඩාවල යෙදෙයි | | | | | | | |
| පන්දු ඇල්ලීම හා වීසි කිරීම ආශ්‍රිත ක්‍රීඩාවල යෙදෙයි | | | | | | | |
| පන්දුවක් එල්ලයට වීසිකරයි. තමා වෙත එවූ පන්දුව අල්ලය* | | | | | | | |
| පොළොවට අඩියක් පමණ ඉහළින් තිරස් ව තබන ලද දණ්ඩක් මත සමබර ව ඇවිදියි* | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 6-ගායන/වාදන හෝ රංගන | | | | | | | |
| කවි ගී ගායනා හා රංගන ඉදිරිපත් කරයි | | | | | | | |
| චරිත නිරූපණවල යෙදෙයි | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ආදේශ භාණ්ඩ යොදා ගනිමින් සමූහ වාදනයේ යෙදෙයි | | | | | | | |
| සංචලන ක්‍රියාකාරකම්වල යෙදෙයි | | | | | | | |
| නිසි රිද්මයට අනුව සංචලන ක්‍රියාකාරකම්වල යෙදෙයි | | | | | | | |
| කවියක් හෝ ගීතයක් හෝ රංගනයක් සහිත ව<br>තනි ව ගායනා කරයි* | | | | | | | |
| චරිතාරෝපිත ව රංගනයේ යෙදෙයි* | | | | | | | |
| තාල තැබීමෙන් හෝ රංගනයෙන් යුතුව සාමූහික | | | | | | | |
| ගායනයට එක් වෙයි. | | | | | | | |
| සරල කවියක්, ගීයක් තාලානුකූල ව තනි තනි ව ගායනා කරයි* | | | | | | | |
| සාමූහික ප්‍රසංගයක දී ගායනයෙන් හෝ වාදනයෙන් හෝ | | | | | | | |
| රංගනයෙන් හෝ දායක වෙයි* | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 7-විවිධ නිර්මාණ | | | | | | | |
| තම අදහසක් නිර්මාණශීලී ව ලියා ප්‍රකාශ කරයි* | | | | | | | |
| කැමති මාධ්‍යයක් භාවිත කර නිදහස් චිත්‍රයක් ඇඳ<br>එයින් නිරූපණය වන දේ විස්තර කරයි. | | | | | | | |
| චිත්‍රයක් නිදහසේ ඇඳ එය පැහැදිලි කරයි. | | | | | | | |
| අත්දැකීමක් චිත්‍රයක් මගින් ප්‍රකාශ කර විස්තර කරයි. | | | | | | | |
| තම අදහස් හා හැඟීම් චිත්‍ර මගින් ප්‍රකාශ කරයි | | | | | | | |
| විවිධ අවස්ථා චිත්‍ර මගින් ප්‍රකාශ කරයි | | | | | | | |
| මැහුම් ගෙතුම් ඇසුරෙන් නිර්මාණ කරයි | | | | | | | |
| රටා හා මෝස්තර නිර්මාණ කරයි | | | | | | | |
| තම ප්‍රදේශ ආශ්‍රිත සම්පත් ඇසුරෙන් සරල නිර්මාණයක් කරයි. | | | | | | | |
| වෙනත් විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණ කරයි. | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 8-කියවීම/රසාස්වාදය | | | | | | | |
| සරල කවි, නැළවිලි කවි. ළමා ගීවලට සවන් දෙමින්<br>වින්දනය ලබයි | | | | | | | |
| කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි | | | | | | | |
| ළමා නාට්‍ය  නරඹමින් වින්දනයක් ලබයි | | | | | | | |
| කාටූන්, ළමා නාට්‍ය, චිත්‍ර කථා , පොත් කියවා | | | | | | | |
| වින්දනයක් ලබයි | | | | | | | |
| බිත්ති පුවත්පත්, නිර්මාණ පැදුර කියවා ප්‍රතිචාර දක්වයි | | | | | | | |
| කියවීමේ පුරුද්ද ප්‍රදර්ශනය කරයි | | | | | | | |
| පොත් එකතු කරගෙනහුවමාරු කර ගනිමින් කියවා ප්‍රතිචාර දක්වයි | | | | | | | |
| පොතක පටුන භාවිත කරයි | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 10-තොරතුරු ලබා ගැනීම හා උපයෝගී කර ගැනීම | | | | | | | |
| එදිනෙදා පන්ති කාමරයේ ලැබෙන විධානවලට ප්‍රතිචාර දක්වයි | | | | | | | |
| කරුණු දැන ගැනීම සඳහා ප්‍රශ්න කරයි | | | | | | | |
| යොමු කරන කරුණකට අදාළව කරුණු රැස් කරයි | | | | | | | |
| වැඩිහිටියන්ගෙන් හා වෙනත් අදාළ පුද්ගලයන්ගෙන් කරුණු විමසමින්<br>තොරතුරු රැස් කිරීමට උනන්දු වෙයි. | | | | | | | |
| නිවේදනයකට සවන් දී අවබෝධ කරගෙන වැදගත් කරුණු<br>සටහන් තබා ගනියි* | | | | | | | |
| නොදන්නා දේ දැන ගැනීමට හා අවශ්‍ය කරුණු වඩාත් පැහැදිලි<br>කර ගැනිමට ආචාරශීලී ව ප්‍රශ්න කරයි* | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 11-තාක්ෂණික/ශිල්පීය හැකියාව | | | | | | | |
| තමාට සාපේක්ෂ ව වමත් පස හා දකුණත් පස පිහිටි වස්තු නම් කරයි* | | | | | | | |
| ප්‍රධාන දිශා හතර හඳුනා ගෙන දෛනික අවශ්‍යතා සඳහා භාවිත කරයි* | | | | | | | |
| පන්ති කාමරයේ දළ සැලැස්මක් අඳියි. | | | | | | | |
| යොමු කරන දළ සැලැස්මක් යටතේ දළ ආකෘති නිර්මාණය කරයි. | | | | | | | |
| ඉඳිකටු නූල් භාවිතයෙන් ඇඳුමකට බොත්තමක් අල්ලය. | | | | | | | |
| හීන් නූල් දුවවීමෙන් රෙදි කැලි දෙකක් මූට්ටු කරයි. | | | | | | | |
| උපකරණ නිවැරදි ව භාවිතා කරයි | | | | | | | |
| කතුරකින් දාරය දිගේ කපා පින්තූරයක් වෙන් කර ගනියි. | | | | | | | |
| දිග, බර හා ධාරිතාව ආශ්‍රිතව එදිනෙදා ජීවිතයේ දී මුහුණ දෙන ගැටලු විසඳයි. | | | | | | | |
| තමාගේ තොරතුරු ඇසුරින් ආකෘති පත්‍රයක් නිවැරදිව පුරවයි. | | | | | | | |
| ආකෘති පත්‍රයක් නිවැරදි ව සම්පූර්ණ කරයි. | | | | | | | |
| ඉදිරිපත් කරනු ලබන වැඩ සටහනක් පිටපත් කරයි. | | | | | | | |
| ආරාධනා පත්‍රයක් කියවා එහි වැදගත් කරුණු ප්‍රකාශ කරයි. | | | | | | | |
| වගුවක ඇති තොරතුරු වාචික ව විස්තර කරයි. | | | | | | | |
| තීර ප්‍රස්තාරයකින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු කියවයි. | | | | | | | |
| තීර ප්‍රස්තාරයක් කියවා වැදගත් කරුණු අවබෝධ කර ගනියි. | | | | | | | |
| තම ළැදියා හා රුචිකත්වයන්ට අදාළ කුසලතාවක් වර්ධනය කර ප්‍රදර්ශනය කරයි. | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 12-ගවේෂණශීලී/විචාරශීලීබව | | | | | | | |
| කරුණු දැන ගැනීම සඳහා ප්‍රශ්න කරයි. | | | | | | | |
| යොමු කරන කරුණකට අදාළව කරුණු රැස් කරයි | | | | | | | |
| වැඩිහිටියන්ගෙන් හා වෙනත් අදාළ පුද්ගලයන්ගෙන් කරුණු විමසමින් තොරතුරු රැස් කිරීමට උනන්දු වෙයි | | | | | | | |
| අත්හදා බැලීම්වලට හා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට | | | | | | | |
| උනන්දුවෙන් සහභාගී වෙයි | | | | | | | |
| සරල අත්හදා බැලීම් කරයි | | | | | | | |
| සරල පරීක්ෂණවල යෙදෙමින් තොරතුරු වාර්තා කරයි සරල පරීක්ෂණයක අනාවරණය ප්‍රකාශ කරයි. | | | | | | | |
| ගවේෂණශීලී ව වැඩක නියැළෙයි | | | | | | | |
| විචාරශීලීව වැඩක නියැළෙයි | | | | | | | |
| නව දැනුම සොයා ගැනීම සඳහා විවිධ ක්‍රම උපයෝගී කර ගැනීමට පෙළඹේ. | | | | | | | |
| නිරීක්ෂණ හා පරීක්ෂණ මගින් අනාවරණය කර ගන්නා | | | | | | | |
| තොරතුරු වාර්තා කරයි. | | | | | | | |
| මුහුණ දෙන යම් කිසි ගැටලුවකට විසඳුම් කිහිපයක් ඉදිරිපත් කරයි. | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 13-නිර්මාණශීලී බව | | | | | | | |
| නිර්මාණශීලී ව කාර්යයක නියැළෙයි | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 14-ස්වයං ඉගෙනුමේ යෙදීම | | | | | | | |
| ස්වයං ඉගෙනුමට පෙළඹෙයි | | | | | | | |
| ස්වයං ඉගෙනුමෙහි යෙදෙමින් අන්‍යයන් දැනුවත් කරයි | | | | | | | |
| ලිඛිත ව ඉදිරිපත් කරන තම පිළිතුරු පිළිබඳ ව ස්වයං ඇගයීමක යෙදෙයි* | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

| 15-කණ්ඩායමක වැඩ කිරීමේ හැකියාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යමක් කිරීමට කැමැත්තෙන් ඉදිරිපත්වෙයි | | | | | | | |
| නායකත්වයට ගරු කර කටයුතු කරයි | | | | | | | |
| කණ්ඩායමක් තුළ සහයෝගයෙන් කටයුතු කරයි. | | | | | | | |
| වැඩක් සාමූහික ව කිරීම තුළින් එහි වැඩි සාර්ථකත්වයක් අත් විඳියි. | | | | | | | |
| සාමූහික කාර්යයක් සැලසුම් කිරීමේ සිට සාර්ථක ව නිම කිරීම තෙක් දායක වෙයි. | | | | | | | |
| එක්ව කටයුතු කිරීමෙන් වැඩ පහසු වන බව අවබෝධ කරගෙන ක්‍රියා කරයි. | | | | | | | |
| වැඩක් සාමූහික ව කිරීම තුළින් එහි වැඩි සාර්ථකත්වයක් අත් විඳියි. | | | | | | | |
| සාමූහික කාර්යයක් සැලසුම් කිරීමේ සිට සාර්ථකව නිම කිරීම තෙක් දායක වෙයි. | | | | | | | |
| කණ්ඩායම් වශයෙන් ආහාරයක්/පානයක් පිළියෙළ කරයි. | | | | | | | |
| නායකත්වය හා සම්බන්ධ පවරන ලද වගකීමක් නිසි ලෙස ඉටු කරයි. | | | | | | | |
| තමා අවට පරිසරයේ ඇති ද්‍රව්‍ය උපයෝගී කර ගෙන කණ්ඩායමක් වශයෙන් නිමාවක් සහිත නිර්මාණයක් කර සතුටු වෙයි. | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 16-වැඩෙහි යෙදීම | | | | | | | |
| එදිනෙදා ප්‍රධාන කාර්යයන් කීපයක් කාල සටහනකට අනුව ඉටු කරයි. | | | | | | | |
| නිමාවක් දකින තුරු අවධානයෙන් වැඩ කරයි | | | | | | | |
| නිමාවක් දකින තුරු උනන්දුවෙන් වැඩ කරයි | | | | | | | |
| ආරම්භයේ සිට අවසානය තෙක් වැඩක නියැළෙයි | | | | | | | |
| පැහැදිලි නිමාවක් සහිතව කාර්යයක් අවසන් කරයි | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

## පුරවැසි නිපුණතා

| 21-පොදු සම්පත් සුරැකීම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| එදිනෙදා භාවිතා කරන භාණ්ඩ හා උපකරණ ආරක්ෂාකාරී ව පරිහරණය කර ආරක්ෂාකාරී ව නිසි තැන තබයි. | | | | | | | |
| තම පන්ති කාමරයේ ඇති සම්පත් ආරක්ෂා වන ලෙස පරිහරණය කරයි. | | | | | | | |
| පන්ති කාමරය තුළ පරිහරණය කරන ලද උපකරණ හා ද්‍රව්‍ය නිසි තැන තබයි. | | | | | | | |
| වෙනත් පොදු වස්තූන් ද සැලකිල්ලෙන් පරිහරණය කරයි. | | | | | | | |
| පොදු වස්තූන් ආරක්ෂා කරමින් අන්‍යයන් ද ඒ සඳහා උනන්දු කරයි | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 22-පොදු කටයුතු වල යෙදීම. | | | | | | | |
| පොදු කටයුතු සඳහා කැමැත්තෙන් ඉදිරිපත් වෙයි. | | | | | | | |
| පොදු කටයුතුවල දී අන්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. | | | | | | | |
| වටපිටාවේ පිරිසිදුකම ගැන සැලකිලිමත් වෙයි. | | | | | | | |
| අවට පරිසරය පවිත්‍රව තබා ගැනීමට දායක වෙයි. | | | | | | | |
| තම පාසල තුළ කරන පොදු කටයුතුවල දී අන්‍යෝන්‍ය සහයෝගයෙන් වැඩ කරයි. | | | | | | | |
| තමාගේත් තමාට සමීප පරිසරයේත් පිරිසිදුකම ගැන සැලකිලිමත් ව කටයුතු කරයි. | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

| 23-බහු විධ සමාජයක ජීවත් වීම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 16.4 වයස අඩු සහ වැඩි අයගේ චර්යා රටා අවබෝධ කරගෙන ඒ අනුව හැසිරෙයි. | | | | | | | |
| සියලූ ම ජන කොටස්වල අනන්‍යතාවයට ගරු කරමින් සහයෝගයෙන් කටයුතු කරයි. | | | | | | | |
| සමානාත්මතාව | | | | | | | |
| මිනිසත් බව අගය කරමින් ජීවත් වීම | | | | | | | |
| සමාජයේ යහපැවැත්මට තුඩු දෙන යුතුකම්, අයිතිවාසිකම් හා වගකීම් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි. | | | | | | | |
| ලාංකික ජන කොටස් අතර මිත්‍රශීලී ආකල්ප ගොඩ නැගෙන අයුරින් ක්‍රියා කරයි. | | | | | | | |
| අන් ආගමිකයන්ගේ අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවලට ගරුත්වයෙන් යුතු ව කටයුතු කරයි. | | | | | | | |
| අන් අය අකමැති හැසිරීම්වලින් වැළකී සිටීමට ක්‍රියා කරයි. | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| 24-පරිසර හිතකාමී බව | | | | | | | |
| පරිසරයට ආදරය කරයි | | | | | | | |
| ගස් වැල් හා ජලය ආරක්ෂා කරගනිමින් පරිසරය සුරැකීමට දායක වෙයි. | | | | | | | |
| දිරාපත්වන දේවල් යොදා ගනිමින් පස සරු බවට පත්කර ගැනීමට උනන්දු වෙයි. | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

## විෂය නිපුණතා

| ඹ ඹඹ ඹඹ | 1වන වාරය | | | 2වන වාරය | | | 3වන වාරය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සැලසුම | ඇරඹුම | අවසන | සැලසුම | ඇරඹුම | අවසන | සැලසුම | ඇරඹුම | අවසන |
| 31 - ගණිතය | | | | | | | | | |
| 1 - පූර්ව ගණිත නිපුණතා | | | | | | | | | |
| 1.1 ද්‍රව්‍ය හෝ ද්‍රව ප්‍රමාණ දෙකක් ලොකු කුඩා හෝ වැඩි අඩු වශයෙන් වෙන් කර හඳුනා ගනිමු. | | | | | | | | | |
| 1.2 එකක් පිටුපස එකක් ඉදිරියට යන ආකාරයට තබන ලද ආකෘති තුනක, රූප තුනක සත්ව හෝ වාහන එක් එක් ආකෘතියක්, එක් එක් රූපයේ සාපේක්ෂ පිහිටීම ඉදිරියෙන්ම, මැදින් හා පිටුපසින්ම වශයෙන් දැක්වීම. | | | | | | | | | |
| 1.3 තම වෙනස් එකම හැඩයේ එකම වර්ගයේ ද්‍රව්‍ය තුනක් විශාලත්වය අනුව පටිපාටියට අනුව | | | | | | | | | |
| 1.4 තරම වෙනස් එකම හැඩයේ රූපසහිත එක හා සමාන පත්‍රිකා තුනක ඇති රූපවල විශාලත්වය අනුව පත්‍රිකා පටිපාටියට තැබීම. | | | | | | | | | |
| 1.5 එක් කට්ටලයක ඇති ද්‍රව්‍ය තවත් කට්ටලයක ඇති ද්‍රව්‍ය සමග එකට එක ගලපා ද්‍රව්‍ය සංඛයා අඩු වැඩි හෝ සමාන වශයෙන් සැසඳීම. | | | | | | | | | |
| 1.6 රූප පත්‍රිකා කට්ටලයක ඇති රූප තවත් කට්ටලයක ඇති රූප සමග එකට එක ගලපා රූප සංඛ්‍යා අඩු, වැඩි හෝ සමාන හෝ වශයෙන් සැසඳීම. | | | | | | | | | |
| 1.7 ද්‍රව්‍ය සංඛ්‍යා සමාන වන කට්ටල දෙකකින් එක කට්ටලයක අඩංගු ද්‍රව්‍ය සංඛ්‍යාව වර්ගය, පාට, හැඩය, තරම, පිහිටීම යන කවර හෝ උපලක්ෂණයකින් වෙනස් වුව ද කට්ටල දෙකේ අඩංගු වන ඒ ඒ ද්‍රව්‍ය සංඛ්‍යා සමානව පවතින බව දැක්වීම. | | | | | | | | | |
| 1.8 දෙන ලද ද්‍රව්‍ය කට්ටලයක් වරකට එක් උපලක්ෂණයක් (වර්ගය, පාට, හැඩය හා තරමඃඅනුව ගොඩවලට වෙන් කිරීම වෙන් කළආකාරය පිළිබඳ හේතු දැක්වීම හා ඒ ඒ ගොඩ නම් කිරීම. | | | | | | | | | |
| 1.9 සරල රටාවකට පෙළ ගස්වන ලද ද්‍රව්‍ය කිහිපයක, රූප කිහිපයක රටාව හඳුනා ගැනීම. | | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ● බොහෝ දුරට එක සමාන එහෙත් වෙනස්කම් කීපයක් සහිත පින්තූර දෙකක් නිරීක්ෂණය කර වෙනස්කම් පහක් හඳුනාගෙන ප්‍රකාශ කරයි. | | | | | | | | | |
| ● සිද්ධියක ප්‍රධාන අවස්ථා දැක්වෙන පින්තූර හතරක් අනුපිළිවෙළින් සකස් කරයි | | | | | | | | | |
| ● පාට දෙකකින්, හා තරම දෙකකින් හා හැඩ දෙකකින් යුත් ද්‍රව්‍ය කට්ටලයක් වරකට එක් ගුණයක් අනුව ගොඩවලට වෙන්කර එයට හේතු දක්වයි. | | | | | | | | | |
| ● රටාවකට අනුව පෙළ ගස්වන ලද රූප කිහිපයක ඊළඟට ආ යුතු රූපය අඳියි. | | | | | | | | | |
| 2 - සංඛ්‍යා | | | | | | | | | |
| 2.1.1 20 තෙක් සංඛ්‍යා නාම අනුපිළිවෙළින් කීම. | | | | | | | | | |
| 2.1.2 එකම වර්ගයේ ද්‍රව්‍ය 20ක් ගණන් කිරීම. | | | | | | | | | |
| 2.1.3 පළමුවැනි, දෙවැනි, තුන්වැනි, වශයෙන් පිහිටන ස්ථාන 9 තෙක් නම් කිරීම. | | | | | | | | | |
| 2.1.4 රටාවකට පිහිටන සේ ඇඳ ඇති එකම වර්ගයේ රූප 20ක් ගණන් කිරීම. | | | | | | | | | |
| 2.1.5 රටාවකට නොපිහිටින සේ ඇඳ ඇති එකම වර්ගයේ රූප 20ක් ගණන් කිරීම. | | | | | | | | | |
| 2.2.6 1 සිට 9 තෙක් එක් එක් සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය, රූප ප්‍රමාණය දැක්වීම. | | | | | | | | | |
| 2.2.7 1 සිට 9 තෙක් එක් එක් සංඛ්‍යාවකට අදාළ ද්‍රව්‍ය ප්‍රමාණයට, රූප ප්‍රමාණයට දැක්වීම. | | | | | | | | | |
| 2.2.8 1 සිට 9 තෙක් එක් එක් සංඛ්‍යාංකයට අනුරූප සංඛ්‍යා නාමය ලිවීම. | | | | | | | | | |
| 2.3.1 එකතුව 9ට නොවැඩි වන ද්‍රව්‍ය කට්ටල දෙකක් එකතු කිරීම. | | | | | | | | | |
| 2.3.2 එකතුව 9ට නොවැඩි වන රූප කට්ටල දෙකක් එකතු කිරීම. | | | | | | | | | |
| 2.3.2 එකතුව 9ට නොවැඩි වන සංඛ්‍යා දෙකක් හෝ රූප ඇසුරෙන් එකතු කිරීම. | | | | | | | | | |
| ● 1 සිට 50 තෙක් ඕනෑම සංඛ්‍යාවක් කියවයි. | | | | | | | | | |
| ● 10 සිට 100 තෙක් සංඛ්‍යා නාම දහයෙන් දහය අනුපිළිවෙළින් හා මතකයෙන් කියවයි | | | | | | | | | |
| ● 20ට අඩු ද්‍රව්‍ය ගොඩක ගණන් කර අගය ඉලක්කමෙන් ලියයි. | | | | | | | | | |
| ● හඳුනා ගත හැකිවන පරිදි ඉලක්කම් පැහැදිලිව ලියයි. | | | | | | | | | |
| ● 9 නොවැඩි සංඛ්‍යාවකින් ඊට අඩු සංඛ්‍යාවක් අඩුකර ලියා දක්වයි. | | | | | | | | | |
| ● තනි ඉලක්කමේ සංඛ්‍යා දෙකක එකතුව ලියා දක්වයි. | | | | | | | | | |
| 3-මිනුම් | | | | | | | | | |
| 3.1.1 වස්තු දෙකක හෝ පුද්ගලයන් දෙදෙනෙකුගේ හෝ උස අඩු, වැඩි, සමාන වශයෙන් සැසඳීම | | | | | | | | | |
| 3.1.2 වස්තු දෙකක දිග අඩු, වැඩි, සමාන වශයෙන් සැසඳීම. | | | | | | | | | |
| 3.1.3 දිග එකිනෙකට වෙනස් වස්තු තුනක දිගම හෝ කොටම හෝ වස්තුව හඳුනා ගැනීම | | | | | | | | | |
| 3.1.4 උස එකිනෙකට වෙනස් වස්තු තුනක හෝ පුද්ගලයින් තිදෙනෙකු අතුරින් උස ම, මිටි ම, වස්තුව හෝ පුද්ගලයා හෝ හඳුනා ගැනීම. | | | | | | | | | |
| 3.2.1 බරෙහි පැහැදිලි වෙනසක් ඇති වස්තු දෙකක්, එකක් අනෙකට වඩා බර අඩු, බර වැඩි වශයෙන් සැසඳීම. | | | | | | | | | |
| 3.3.1 ධාරිතාව වෙනස් බඳුන් දෙකක් ඉදිරිපත් කොට පිරෙන තෙක් එකිනෙකට දැමිය හැකි ද්‍රව ප්‍රමාණයන්ගේ අඩුවැඩි බව හඳුනා ගැනීමට සැලැස්වීම. | | | | | | | | | |
| ● දිගක් දෙන ලද අභිමත ඒකකයකින් මැන, ආසන්න අගය අභිමත ඒකක කීය දැයි ප්‍රකාශ කරයි. | | | | | | | | | |
| ● වස්තුවක බර අභිමත එකකින් මැන, ආසන්න අගය අභිමත ඒකක කීයදැයි ප්‍රකාශ කරයි. | | | | | | | | | |
| 4 - මුදල් | | | | | | | | | |
| ● 4.0.1 රුපියල, රුපියල් දෙක සහ රුපියල් පහ යන කාසි හඳුනා ගැනීම. | | | | | | | | | |
| ● 4.0.2 තනි කාසියක් භාවිතා කර ගනුදෙනු කිරීම. | | | | | | | | | |
| ● රුපියල් පහ රුපියල් දෙක, රුපියල, සත පනහ සහ සත විසිපහ යන කාසි හඳුනාගෙන නම් කරයි. | | | | | | | | | |
| 32 - මවුබස | | | | | | | | | |
| 1-පූර්ව භාෂා කුසලතා | | | | | | | | | |
| 1.1.1 පරිසරයේ ඇති ශබ්ද වෙන්කර හඳුනා ගනියි. | | | | | | | | | |
| 1.1.2 පරිසරයේ ස්වාභාවික ශබ්ද වෙන් කර හඳුනාගෙන නම්කරයි. | | | | | | | | | |
| 1.1.3 පරිසරයේ කෘතිම ශබ්ද වෙන් කර හඳුනාගෙන නම්කරයි. | | | | | | | | | |
| 1.1.4 රූපවල සියුම් වෙනස්කම් දකියි. | | | | | | | | | |
| 1.1.5 අකුරු රූප අතර වෙනස දකියි | | | | | | | | | |
| 1.3.1 වමේ සිට දකුණට ඇස යොමු කෙරෙන ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | | | | | | | | | |
| 1.3.2 විශාල මාංශපේශි සම්බන්ධ ක්‍රියාකාරකම් සමග ඇස අත සමායෝජනය කරයි. | | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1.3.3 සියුම් මාංශපේශි සම්බන්ධ ක්‍රියාකාරකම් සමග ඇස අත සමායෝජනය කරයි | | | | | | | | | |
| 1.4.1 පින්තූර කියවයි. | | | | | | | | | |
| 1.4.2 පින්තූර කතා කියවයි. | | | | | | | | | |
| 1.4.3 අකුරු රූපය දකිමින් පින්තූරය කියවයි. | | | | | | | | | |
| 1.5.1 ලිවීමේ උපකරණ නිවැරදිව හසුරුවයි. | | | | | | | | | |
| 1.5.2 නිදහසේ කුරුටුගායි. | | | | | | | | | |
| 1.5.3 කඩ ඉරි මත හැඩ අඳියි. | | | | | | | | | |
| 1.5.4 අකුරු වලට අයත් හැඩ අඳියි. | | | | | | | | | |
| 1.5.5 කඩ ඉරි වලින් දෙන ලද අකුරු, රටා වශයෙන් අඳියි. | | | | | | | | | |
| 1.5.6 අකුරු හැඩ, රටා වශයෙන් අඳියි. | | | | | | | | | |
| 2-සවන් දීම. | | | | | | | | | |
| 2.1.1 නැළවිලි කවිවලට සවන් දෙමින් වින්දනය ලබයි. | | | | | | | | | |
| 2.1.2 ළමා ගීවලට සවන් දෙමින් වින්දනය ලබයි. | | | | | | | | | |
| 2.1.3 සරල කවිවලට සවන් දෙමින් වින්දනය ලබයි. | | | | | | | | | |
| 2.1.4 සරල කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි. | | | | | | | | | |
| 2.2.1 විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | | | | | | | | | |
| 2.2.2 කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | | | | | | | | | |
| 2.2.3 කවි /ගීවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | | | | | | | | | |
| 2.3.1 කෙටි විධානවලට සවන් දී අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | | | | | | | | | |
| 2.3.2 සරල පණිවුඩවලට සවන් දී අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | | | | | | | | | |
| 2.3.3 සරල උපදෙස්වලට සවන් දී අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | | | | | | | | | |
| 03 - කතා කිරීම | | | | | | | | | |
| 3.1.1 ළමා කවි ගායනා කරයි | | | | | | | | | |
| 3.1.2 ළමා ගී ගායනා කරයි | | | | | | | | | |
| 3.2.1 සුහද කතා බහේ යෙදෙයි | | | | | | | | | |
| 3.2.2 තම අවශ්‍යතා සඳහා ප්‍රශ්ණ අසයි | | | | | | | | | |
| 3.3.1 පන්තිය තුළ පණිවුඩ ගෙන යයි | | | | | | | | | |
| 3.4.1 තම අත්දැකීම් කියයි | | | | | | | | | |
| 3.4.2 ආරංචි කියයි | | | | | | | | | |
| 3.4.3 කතන්දර කියයි | | | | | | | | | |
| 3.5.1 පින්තූරයක් ඇසුරෙන් කතා බහ කරයි | | | | | | | | | |
| 3.5.2 පින්තූර කට්ටලයකින් කතන්දර ගොඩ නගයි. | | | | | | | | | |
| 4-කියවීම | | | | | | | | | |
| 4.1.01 පිල්ලම් රහිත අකුරු යෙදුණු වචන ශබ්ද නගා කියවයි | | | | | | | | | |
| 4.1.02 ඇල පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.03 උස් පිල්ල, උඩු පිල්ල (හල් කිරීම් දෙක) යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.04 ඉස් පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.05 දීර්ඝ ඉස් පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.06 පා පිලි යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.07 දීර්ඝ පා පිලි යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.08 ඇද පිල්ල (ඇදය) යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.09 දීර්ඝ ඇද පිල්ල (ඇදය) යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.10 කොම්බුව යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.11 කොම්බුව සහ ඇල පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.12 කොම්බුව, ඇල පිල්ල සහ හල් කිරීම යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.13 පිල්ලම් කිහිපයක් යෙදුණු අකුරු සහිත වචන කියවයි | | | | | | | | | |
| 4.1.14 පිල්ලම් රහිත අකුරු වලින් යුතු වචන සහිත සරල වාක්‍ය කියවයි | | | | | | | | | |
| 4.1.15 පිල්ලම් කිහිපයක් යෙදුණු අකුරු සහිත වචන වලින් යුතු සරල වාක්‍ය කියවයි | | | | | | | | | |
| 4.1.16 නැවතීමේ ලකුණ ගැන සැලකිලිමත් ව සරල වාක්‍ය කියවයි | | | | | | | | | |
| 4.1.17 යංශය, රකාරාංශය යෙදුණු පුද්ගල හා ස්ථාන නාම කියවයි | | | | | | | | | |
| 4.2.1 සරල වචන කියවමින් අවබෝධ කර ගනියි | | | | | | | | | |
| 4.3.1 එකම රටාවේ වචන කියවයි | | | | | | | | | |
| 4.3.2 එකම අකුරෙන් පටන් ගන්නා වචන කියවයි | | | | | | | | | |
| 4.3.3 පන්තියේ සිසුන්ගේ නම් කියවයි | | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4.3.4 තම පරිසරයේ ඇති ද්‍රව්‍යවල නම් කියවයි | | | | | | | | | |
| • සරල වැකියක් කියවා අසනු ලබන ප්‍රශ්ණ දෙකකට වාචිකව පිළිතුරු දෙයි. | | | | | | | | | |
| • ඉදිරිපත් කරනු ලබා වැකි තුනක් නිවැරදි උච්චාරණය සහිතව ශබ්ද නගා කියවයි. | | | | | | | | | |
| 5-ලිවීම | | | | | | | | | |
| 5.1.1 අකුරක හැඩය හා නියමිත අංග සහිත ව ලියයි | | | | | | | | | |
| 5.1.2 රූල මත අකුරු ලියයි | | | | | | | | | |
| 5.2.1 පිල්ලම් රහිත අකුරු දෙකකට වැඩි නොවන අකුරු යෙදුණු වචන ලියයි | | | | | | | | | |
| 5.2.2 පිල්ලම් රහිත අකුරු තුනකට වැඩි නොවන අකුරු යෙදුණු වචන ලියයි | | | | | | | | | |
| 5.2.3 එක පිල්ලමක් සහිත අකුරු තුනකට වැඩි නොවන අකුරු යෙදුණු වචන ලියයි | | | | | | | | | |
| 5.3.1 තමා පිළිබඳ ව මූලික තොරතුරු ලියයි (නම, ගම) | | | | | | | | | |
| 5.3.2 අවට පරිසරයේ දක්නට ඇති දේවල නම් ලියයි | | | | | | | | | |
| 5.3.3 පින්තූරයක් දෙස බලා එහි ඇති දේවල නම් ලියයි | | | | | | | | | |
| 5.3.4 ගම්වල නම් ලියයි | | | | | | | | | |
| 5.4.1 යම් අදහසක් වචන දෙකකින් ලියයි | | | | | | | | | |
| 5.4.2 වචන තුනකට අඩු නොවන සරල වැකි ලියයි | | | | | | | | | |
| • තමාගේ නමලියයි. | | | | | | | | | |
| • පින්තූරයක් බලා ඒ පිළිබඳව සරල වැකියක් ලියයි* | | | | | | | | | |
| • සරල වචන අසා ලියයි | | | | | | | | | |
| • සරල වැකියක් නිවැරදිව හා හඳුනා ගත හැකි පරිදි අකුරු පැහැදිලිව පිටපත් කරයි | | | | | | | | | |
| 33 - දෙවන බස | | | | | | | | | |
| • උචිත අවස්ථාවන්හි සරල දෙමළ වචන භාවිතා කරයි | | | | | | | | | |
| • අවස්ථානුකූලව දෙමළ බසින් සුබ පැතුම් වදන් භාවිතා කරයි | | | | | | | | | |
| 34 - ඉංග්‍රීසි | | | | | | | | | |
| • ඉංග්‍රීසියෙන් කෙටි සරල වාක්‍ය කතා කරයි. | | | | | | | | | |
| 35 - බුද්ධාගම | | | | | | | | | |
| 1-බෞද්ධ දරුවකුගේ අනන්‍යතාවය ප්‍රදර්ශණය වීම | | | | | | | | | |
| 1.1.1 සුදුසු ඇඳුමකින් යුක්ත වීම | | | | | | | | | |
| 1.1.2 හිස් වැසුම්, පාවාහන් ගැලවීම | | | | | | | | | |
| 1.1.3 සංවර බව | | | | | | | | | |
| 1.1.4 අත් ධෝවනය කිරීම | | | | | | | | | |
| 1.1.5 මල් ධෝවනය කිරීම | | | | | | | | | |
| 1.2.01 නමස්කාරය, තෙරුවන් සරණයාම හා පන්සිල් ගැනීම | | | | | | | | | |
| 1.2.02 තෙරුවන් වන්දනා කිරීම | | | | | | | | | |
| 1.2.03 පහන් පූජා කිරීම | | | | | | | | | |
| 1.2.04 සුවඳ දුම් පූජා කිරීම | | | | | | | | | |
| 1.2.05 මල් පූජා කිරීම | | | | | | | | | |
| 1.2.06 බෝධි රාජයාණන් වහන්සේ වන්දනා කිරීම | | | | | | | | | |
| 1.2.07 චෛත්‍ය රාජයාණන් වහන්සේ වන්දනා කිරීම | | | | | | | | | |
| 1.2.08 බුදු පිළිමවහන්සේ වන්දනා කිරීම | | | | | | | | | |
| 1.2.09 මෙත් වැඩීම | | | | | | | | | |
| 1.2.10 ප්‍රාර්ථනා | | | | | | | | | |
| 1.3.1 හුනස්නෙන් නැගිටීම | | | | | | | | | |
| 1.3.2 සංඝරත්නයට වැඳීම | | | | | | | | | |
| 1.3.3 සංවරව සිටීම | | | | | | | | | |
| 1.4.1 සමානාත්මතාව | | | | | | | | | |
| 1.4.2 කරුණාව හා දයාව | | | | | | | | | |
| 1.4.3 සහයෝගතාව | | | | | | | | | |
| 2-බුදු සිරිත ඇසුරෙන් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හඳුනා ගෙන ජීවිතාදර්ශ ලබා ගැනීම | | | | | | | | | |
| 2.1 වෙසක් පුර පසළොස්වක පෝය ඇසුරෙන් සිදුහත් කුමරුගේ උපත, බුදුවීම හා බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම සම්බන්ධ විශේෂ සිදුවීම් | | | | | | | | | |
| 2.2 මාතුපෝෂක ජාතක කථාව | | | | | | | | | |
| 3-පොදු ගුණදම් වැඩීම | | | | | | | | | |
| 3.1 මව්පියනට වැඳීම - සාලිකේදාර ජාතක කථාව | | | | | | | | | |
| 3.2 මව්පියනට සැලකීම | | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.3 දන් දීම | | | | | | | | | | |
| 3.4 අවිහිංසාව | | | | | | | | | | |
| 4-බෞද්ධ පූජනීය ස්ථානවල ආගමික වටිනාකම හඳුනා ගැනීම | | | | | | | | | | |
